# ස්තූතිය

*පර්යේෂණ කටයුතු සඳහා අරමුදල් ලබාදීම, පර්යේෂණ කාර්ය මණ්ඩලය නුවමාරු කිරීම සහ පුහුණු කිරීමේලා පහසුකම් සැළසීම යනාදිය සිදුකළා වූ ආයතන හා විදේශීය රාජ්‍යයන්ටත් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මෙම මධ්‍යස්ථානය සිය ස්තූතිය පිරිනමන අතර, ඔවුන් දැක්වූ සහයෝගය පිළිබඳ කෘතඥතාවය ද මෙහිලා සඳහන් කරමි.*

*මෙම මධ්‍යස්ථානයේ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක කර ගැනීම සඳහා ඊට නන් අයුරින් සහයෝගය දැක්වූ, ආධාර කලා වූ සමස්ථ කාර්ය මණ්ඩලයටත්, සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය මෙයින් පිරිනැමේ.*



ඉංජි. ඩබ්.පේ.එල්. ශචින්ද්‍රනාත්. ප්‍රනාන්දු
**සභාපති**
**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**



# පටුන


| | මාතෘකාව | පිටු අංක |
|---|---|---|
| 01. | පනත්, නීති හා වස්ථාපිත පාලනය | 02-03 |
| 02. | අධ්‍යක්ෂ මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය | 04-06 |
| 03. | සභාපතිතුමාගේ පණිවිඩය | 07 |
| 04. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්ය මණ්ඩලය | 08-10 |
| 05. | මානව සම්පත් කලමනාකරණය | 11-15 |
| 06. | 2018 වර්ෂයේදී කාර්යසාධනය පිළිඹිමු කිරීම | 16-32 |
| 07. | සුභසාධන හා ආගමික කටයුතු | 33 |
| 08. | ගිණුම්කරණ ප්‍රතිපත්ති | 34-38 |
| 09. | 2018.12.31 දිනට තත්ව ප්‍රකාශය | 39 |
| 10. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය | 40 |
| 11. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 41 |
| 12. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය | 42 |
| 13. | 2018.12.31 දිනට ගිණුම්කරණ සටහන් | 43-50 |
| 14. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව | 51-58 |
| 15. | 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම් | 59-62 |

## 01 පනත්, නීති හා වස්ථාපිත පාලනය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ ප්‍රතිපාදන අනුව 1974 වර්ෂයේදී පිහිටුවන ලද අතර වර්තමානයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන්හි දියුණුව හා ප්‍රගමනය උදෙසා ව්‍යවස්ථාපිත පනතේ අරමුණු පෙරදැරිව ආයතනයේ කාර්යභාරය ඉටුකරනු ලබන අතර ජා ඇල, ඒකල, කාර්මික ජනපදය තුළ පිහිටුවා ඇත.

ආයතනයේ දැක්ම, පරමාර්ථය සහ මෙහෙවර පහත දැක්වේ.



මධ්‍යස්ථානය පිහිටුවන ලද පනතට අනුව වන අරමුණු වනුයේ ;

1. ශ්‍රී ලංකාවේ නව සොයාගැනීම් සහ නිර්මාණ කුසලතාවන්ට ධෛර්ය දීමෙන්ද, ඒවායේ සංවර්ධනයට ආධාර දීමෙන්ද, දේශීය තාක්ෂණය සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

2. සාමූහික ප්‍රයත්නයන් එලදායී අයුරින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය ඉංජිනේරු සහ පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැළසීම.

3. රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණු වලට අනුකූල වන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම

4. අවශ්‍ය වූ විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වකු ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රම පරීක්ෂා කිරීම සහ ඒ ආයතනයන්ට උපදෙස් දීම.

5. උචිත තාක්ෂණික ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් රටේ මානුෂික හා ද්‍රව්‍යමය සම්පත් වලින් විශේෂයෙන්ම ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජනය අත්කර ගැනීමට අනුබල දීම.

6. ඉංජිනේරු ශිල්පීය සැළසුම් පර්යේෂණ පිළිබඳ තාක්ෂණික දත්තයන් සහ ලේඛණාගතය ජාත්‍යාන්තර හා ජාතික නියෝජිත ආයතනයන්ගේ සහයෝගයෙන් යුක්තව අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

7. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබුවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

8. රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ව්‍යවසායනයට අඛන්ඩ උපදේශක සේවාවන් සැලසීම, රටේ ඉංජිනේරු සහ කාර්මික සැළසුම් පදනම මෙන්ම පර්යේෂණ හැකියාවන් පුළුල් කිරීම සඳහා පර්යේෂණ කටයුතු භාර ගැනීම සහ පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම.

9. කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා යන්ත්‍ර භාවිතා කරන්නන් විසින් ඉල්ලුම් කරනු ලැබුවිට ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැළසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

# 02 අධ්‍යක්ෂ මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය

## සභාපති

ඉංජි. ඩබ්.ජේ.එල්. එස්. ප්‍රනාන්දු මයා
B Sc(Hon)Eng., M Eng., FIESL, MIET, C Eng.

## අධ්‍යක්ෂ මණ්ඩලය

**2018.05.31 දක්වා**

1. ඉංජි. ඊ.ඒ.එස්.කේ. එදිරිසිංහ මහතා
   C.Eng., MIET
2. ජී. චන්ද්‍රසිරි මයා
   B Com Degree
3. ඒ.එස්.ආර්. වෛද්‍යසේකර මහතා
   MBA(PIM-USJ), Chartered Marketer
4. ඉංජි. ඒ.එස්. සමරසිංහ මහතා
   MSc, C.Eng.
5. නිලූකා කුමාරි මහත්මිය
   Master of Business Studies, CBA
6. ඒ.එච්.එම්. අන්වර් මහතා

**2018.06.01 සිට**

1. ඉංජි. මංගල පී.බී. මහතා
   M Sc (Hons) Eng, MBA
2. ඉංජි. ඩබ්.පී. ජිනදාස මහතා
   Dip. HE Delft (The Netherlands)
3. සුනිල් ජී. විජේසිංහ මහතා
   MBA
4. එන්.ඩබ්.ඒ.එම්.ඩබ්.යූ.කේ.කේ.ජී. වීරසිංහ මහතා
   ME(Eng), DHRM
5. ඉංජි. ඒ.එස්. සමරසිංහ මහතා
   M Sc, C.Eng
6. නිලූකා කුමාරි මහත්මිය
   Master of Business Studies, CBA

## අධ්‍යක්ෂ ජනරාල් / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), B Sc Eng. (Hons), C Eng., MIE (SL)

## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

### සංවිධාන ව්‍යුහය *(අනුමත බදවාගැනීමේ පරිපාටිය අනුව)*



කාර්යාලය



2පී/17බී, කාර්මික ජනපදය
ඒකල, ජා ඇල.

තැපැල් සංකේත අංකය

11380

ඇමතුම් විස්තරය



+ 94-011-2236284
+ 94-011-2236384
+ 94-011-2236307
+ 94-011-5354597



+ 94-011-2233153



nerdcentre@nerdc.lk

www.nerdc.lk


බැංකු කරුවෝ



- ලංකා බැංකුව - ජා ඇල
- ලංකා බැංකුව - ආයතනික ශාඛාව

විගණකවරු



විගණකාධිපති

විගණකාධිපති දෙපාර්තමේන්තුව

## 03 සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ් ආයතනයේ) 2018 වාර්ෂික වාර්තාව සඳහා කාර්යසාධන සමාලෝචනය ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධනයේ නියැලි රටේ ප්‍රමුඛතම ආයතනයක් ලෙස නර්ඩ් ආයතනය 2018 වර්ෂයේදී සිදුකරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, නියමු ව්‍යාපෘති, වාණිජ ව්‍යාපෘති, කර්මාන්තකරුවන් සඳහා කාර්මික හා තාක්ෂණික සේවාවන් සැපයීම්, තාක්ෂණය වාණිජ්‍යකරණය සහ ප්‍රචලිත කිරීමහි ප්‍රතිලාභ හා ප්‍රතිදාන තුලින් රටේ සංවර්ධනයට අඛණ්ඩව දායක වී ඇත.

ජංගම දුරකථනයට සංඥා නිකුත් කළ හැකි එම මොහොතේද නිරීක්ෂණයන් හා ඡායාරූපගත කිරීම් සිදු කළ හැකි ආරක්ෂිත රොබෝව නිපදවීම, ආරෝග්‍යශාලාවල සායනික සාම්පල් හා රසායනාගාර වාර්තා වායු පුරවන ලද නල ඔස්සේ ප්‍රවාහනය කිරීමේ පද්ධතිය නිර්මාණය කිරීම, නිවාසවල බලශක්තිය වැයවීම කාර්යක්ෂම කිරීම සඳහා වූ ස්වයංක්‍රිය පද්ධතිය නිර්මාණය කිරීම, නර්ඩ් ආදාහනාගාර ඉදිකිරීම් තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම, කුඩා දර කැබලි යෙදවුම් භාවිතා කරමින් තේ වියලීම් දාහකයක් හඳුන්වාදීම, සැහැල්ලු සහ ලාභදායක සෙවිලි උළු කැටයක් නිර්මාණය කිරීම, ස්ලිප් පෝම් බිත්ති යන්ත්‍රානුසාරයෙන් ඉදිකිරීම, අමු තේ දලු පත්‍රවල මතුපිට තෙතමනය මැනීමේ යන්ත්‍රයක් නිපදවීම 2018 වසරේදී නර්ඩ් ආයතනයේ සිදුකරනු ලැබූ ප්‍රධානතම නව පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතීන් වේ.

මධ්‍යස්ථානය විසින් පෙර වසර වලදී ආරම්භ කර ලද පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතීන් වන වීදි ලාම්පු පාලන පද්ධතිය නිර්මාණය කිරීම, සෙවිලි උළු වියලීමේ යන්ත්‍රය නිපදවීම, ප්‍රජා ඝන අපද්‍රව්‍ය කලමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම, අධි පීඩන ඔක්ෂිජන් වායු කුටීරයක් සැළසුම් කිරීම හා නිර්මාණය කිරීම, පොල් කර්මාන්තය සඳහා යන්ත්‍ර සූත්‍ර වැඩිදියුණු කිරීම, ගල් අඟුරු දහනයෙන් ඉවත්වන අළු සහ සිමෙන්ති යොදා ගනිමින් ස්ථාවර සම්පීඩිත පස්ගල් නිර්මාණය කිරීම යනාදිය 2018 වර්ෂයේදී ඉතා හොඳ ප්‍රගතියක් වාර්තා කර ඇත.

අඩි පාලම් සහ වියදම් පිරිමැසුම්දායක රැඳවුම් බැමි ඉදිකිරීම, වාහන ගාල් කිරීමේ සුහුරු පද්ධතියක් හඳුන්වාදීම, දුම් මාළු සැකසුම් යන්ත්‍රය, කොත්මලේ ප්‍රජා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය, ගෘහස්ථ ජීව වායු ජනක පද්ධතිය, පොල් කර්මාන්තය සඳහා දියුණු කරන ලද යන්ත්‍ර යනාදිය සඳහා නියමු ව්‍යාපෘතීන් ද 2018 වසරේදී සම්පූර්ණ කර ඇත.

කර්මාන්තකරුවන් ඇතුළු අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම් මත ඒ ඒ ඉංජිනේරු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම, කර්මාන්තකරුවන් සඳහා අවශ්‍යය තාක්ෂණික සේවා සැපයීම, ඉංජිනේරු සැළසුම් හා නිර්මාණයන් සැකසීම, කර්මාන්ත ශාලාවල කාර්මික ක්‍රියාවලි අධීක්ෂණය හා ප්‍රශස්ත භාවිතයන් සඳහා විසඳුම් ලබාදීම, විද්‍යාගාර පරීක්ෂණ සේවා සැපයීම, පරිසර කළමනාකරණ සේවා සැපයීම්ද 2018 වසර පුරාම සිදු කර ඇත. තවද, කර්මාන්තකරුවන්, තාක්ෂණික වෘත්තිකයන්, ව්‍යවසායකයින්, ආධුනිකයන් සඳහා බලශක්ති හා පාරිසරික කළමනාකරණය, නර්ඩ් තාක්ෂණයන්, ව්‍යවසායකත්ව සංවර්ධනය, කාර්මික යෙදවුම් ස්වයංක්‍රියකරණය, යාන්ත්‍රික උපකරණ නිෂ්පාදන හා පාලන ක්‍රමවේද, කාර්මික සෞඛ්‍ය හා ආරක්ෂණය යනාදී විෂයන් සම්බන්ධයෙන් විශේෂ පුහුණු පාඨමාලා පැවැත්වීමද අඛන්ඩව සිදු කර ඇත.

මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජි. ආනන්ද නාමල් මහතාගේ මෙහෙයවීම, සහයෝගය නොතිබුණේ නම් ඉහත සියළු කර්තව්‍යයන් සාර්ථකව නොවන්නට ඉඩ තිබුණි. මධ්‍යස්ථානයේ සමස්ථ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ඔහු විසින් අඛණ්ඩව දරනු ලබන උත්සාහය, කැපවීම ඉතා අගය කළ යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීම, සහයෝගය සහ මාර්ගෝපදේශනයද කෘතවේදීව සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂවරුන්, දෙපාර්තමේන්තු/ අංශ ප්‍රධානීන්, පර්යේෂණ සහ තාක්ෂණික කාර්යමණ්ඩලය සහ අනෙකුත් සහායක කාර්යමණ්ඩලය සඳහා ද මාගේ ස්තුතිය පුද කරන අතර ඔවුන්ගෙන් ලද සේවාවන් නොවන්නට 2018 වර්ෂය තුල මධ්‍යස්ථානයේ ඉහත ජයග්‍රහණයන් අත්පත් කරගැනීම දුෂ්කර වනු ඇත.

ඉංජි. ඩබ්. ජේ. එල්. ශවින්ද්‍රනාත් ප්‍රනාන්දු
සභාපති

# 04 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සහ විධායක කාර්යමණ්ඩලය

## සභාපති

ඉංජි. ඩබ්.ජේ.එල්. එස්. ප්‍රනාන්දු මයා
B Sc(Hon)Eng., M Eng., FIESL, MIET, C Eng.

## අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. ඩී.ඩී.ඒ. නාමල් මයා
M Eng. (Energy Technology), B Sc Eng. (Hons), C Eng., MIE(SL)

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සහ සංවර්ධන)

ඉංජි. ජී.කේ.කේ.ඒ ද සිල්වා මයා
M Sc (Building Technology), B Sc Eng (Hons), C Eng., MIE (SL)

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සේවා)

ඒ. එච්. පියසිරි මයා
M Sc (Management of Technology), B Sc Eng. (Hons)

## ඉංජිනේරු සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තු වශයෙන්

### සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**අධ්‍යක්ෂ (තාක්ෂණික)**

ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය
M Eng., BSc Eng.,C Eng., MIE (SL)

**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. ඩබ්.ඩබ්.පී.කේ. පෙරේරා මයා
M Eng., BSc Eng. (Hons), C Eng., MIE (SL)

**ඉංජිනේරු**

කේ.එස්.එස්. වීරසිංහ මිය
Special Apprentice (Civil Eng.), IESL (Part I)

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. අයි.පී. බටුවිට මයා
B Sc Eng., AMIE (SL)

ඉංජි. ඒ.එන්.එස්. අමරදාස මයා
BSc Eng., AMIE (SL)

ඉංජි.එම්.එම්.එම්. මනාස් මයා - 2018.04.02 සිට
BSc Eng., AMIE (SL) 2018.12.31 දක්වා

### කෘෂි ඉංජිනේරු සහ යන්ත්‍ර සංවර්ධන දෙපාර්තමේන්තුව

**අධ්‍යක්ෂ (තාක්ෂණික)**

ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා
MSc Eng., BSc Eng., AMIE (SL)

**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු**

වයි.එම්.එම්.කේ. රණතුංග මිය
NDT

ඉංජි. ඒ.ජේ.ජී.එස්. දහනායක මයා
BSc Eng., C Eng., MIE(SL)

**ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ**

ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය - 22/01/2018 දක්වා
PhD., MSc., BSc.

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. පී.එම්.වයි.එස්. පතිරාජ මිය
BSc Eng., MSc., AMIE (SL)

ඉංජි. එස්.ඒ.පී. ශලින්ද සිල්වා මයා
BSc Eng., M Eng., C Eng, MIE (SL)

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. පී.එෆ්.එස්. පෙරේරා මයා
BSc Eng., MEng., AMIE (SL)

ඉංජි. කේ. සිවසුදන් මයා - 2018.04.02 සිට
BSc Eng., AMIE (SL)

## බලශක්ති හා පාරිසරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී**

ඉංජි. ජේ.ඒ.ඒ.ඩී. ජයසූරිය මයා
M Eng., BSc Eng., MIE (SL)

**පර්යේෂණ විද්‍යාර්ථී**

ඉංජි. ඩබ්.කේ.ආර්. පීරිස් මයා
MA (Buddhist Stud), BSc Eng., C.Eng. MIE(SL)

ඉංජි. ඊ. ඒ. එන්.කේ. එදිරිසිංහ මයා
MPhil, BSc Eng., MIE (SL)

**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. එච්.එම්.එල්.යූ. හේරත් මයා
BSc Eng., AMIE (SL)

**පර්යේෂණ ඉංජිනේරු**

එච්.ඒ.කේ. හපුආරච්චි මයා
BSc Eng., AMIE (SL) - 2018.05.03 සිට

## විදුලි හා විද්‍යුත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**පර්යේෂණ විද්‍යාර්ථී/ දෙපාර්තමේන්තු ප්‍රධානී**

ඉංජි. එන්.ජී.ඩී. විජේසිරිවර්ධන මිය
M Eng., C Eng., MIE (SL)

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. යූ.සී. බොතේජු මයා
BSc Eng. C Eng., MIE (SL)

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. ඩී.ආර්.එස්.කේ. විමලරත්න මිය
BTech Hons, AMIE (SL)

ඉංජි. වයි.එස්.පී. වීරසිංහ මයා
BTech. AMIE (SL)

ඉංජි. එච්.කේ.අයි.එස්. ලක්මාල් මයා
BSc Eng. AMIE (SL)

## මෙකට්‍රොනික්ස් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**අධ්‍යක්ෂ (තාක්ෂණික)**

ඉංජි. ඩී.එම්. පුංචිබණ්ඩා මයා
BSc Eng., AMIE(SL)

**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. එච්.පී.එච්. කුමාර මයා
MSc Eng., EC(UK) PART I & II, AMIE(SL)

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. එස්.එම්.එස්. සේනාරත්න මයා
MSc Eng.,B Tech, AMIS(SL)

ඉංජි. ඩබ්.එම්.එස්.පී.කේ. වනසිංහ මයා
B Tech., AMIE(SL)

ඉංජි. එම්.ඒ.ටී.එම්. කුමාර මයා
BSc Eng., AMIE(SL)

ඉංජි. ජේ.ඩී.එම්.එච්. ජයන්තා මිය
BSc Eng, AMIE(SL)

## තාක්ෂණික අලෙවි දෙපාර්තමේන්තුව

**අධ්‍යක්ෂ (තාක්ෂණික)**

ඉංජි. ඒ.ඒ.එස්.පී. ජයසිංහ මයා
BSc Eng.(Hons), MBA, C Eng, MIE(SL)

**පර්යේෂණ විද්‍යාඥ**

බී.ඩී.පී.එස්. රණවීර මිය
BSc.

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි.පී.පී.එස්.එම්.කේ. පොන්සේකා මයා-2018.04.25 සිට
BSc Eng., AMIE (SL) 2018.11.19 දක්වා

**සහකාර අධ්‍යක්ෂ - අලෙවි**

පී.එන්.ඩී. පතිරණ මිය
BSc (Hons) Sp. MCIM (UK), MSLIM (SL)

### තාක්ෂණික ඉන්කියුබේටර් අංශය

**ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු/අංශ භාර නිලධාරී**

ඉංජි. ඒ.ආර්.සී. සල්ගාදු මයා
BSc Eng, AMIE(SL)

**පර්යේෂණ ඉංජිනේරු**

ඉංජි. සුරේශ් පී පෙරේරා මයා
C Eng, MMechE (UK), NDT, AMIE(SL)

### තාක්ෂණ උද්‍යානය සහ ඉංජිනේරු කෞතුකාගාරය

**පාලක - තාක්ෂණ උද්‍යානය**

ඒ.ඒ.එන්.එස්. අධිකාරි මයා - 2018.11.02 දක්වා
BSc (Computer Science), Diploma in IT (UK)

**පාලක - ඉංජිනේරු කෞතුකාගාරය**

ඩී.කේ. ජයවීර මිය
BSc (Hons.)

| බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව | සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව |
|---|---|
| **පර්යේෂණ විද්‍යාර්ථී /දෙපාර්තමේන්තු ප්‍රධානී**<br>ඉංජි. කේ.ටී. ජයසිංහ මයා<br>M Eng., BSc Eng., C Eng., MIE(SL) | **වැ.බ අධ්‍යක්ෂ (තාක්ෂණික)**<br>ඉංජි. කේ.වයි.එච්.ඩී. ශාන්ත මයා<br>MSc Eng., BSc Eng., AMIE(SL) |
| **ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු**<br>ඉංජි. එන්.පී.ටී. පෙරේරා මෙනවිය<br>MSc, BSc Eng. (Hons.), AMIE(SL)<br>ඉංජි. ඒ.ජී.එම්.ටී. සිරිවර්ධන මෙනවිය<br>MSc, MEng, BSc Eng., AMIE(SL) | **ප්‍රධාන පර්යේෂණ ඉංජිනේරු**<br>ඩබ්.පී.ආර්.ඩී. වීරසිංහ මයා<br>NDT, CEI PART I, IESL PART I<br>**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ (ගෘහ නිර්මාණ)**<br>බී.ඩී.ආර්. වාමිකා මිය<br>MSc, BSc. Chartered Architect AIA (SL) |
| **පර්යේෂණ ඉංජිනේරු**<br>ඉංජි. එම්.ඩී. සහර්දීන් මයා<br>BSc Eng., AMIE(SL)<br>ඉංජි. කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා<br>BSc Eng.(Hons), AMIE(SL)<br>ඉංජි. ටී.කේ. ගීගනගේ මයා<br>BSc Eng. AMIE(SL)<br>ඉංජි. ජී.එස්.ආර්. කොස්තා මිය<br>BSc Eng, AMIE(SL)<br>**ඉංජිනේරු**<br>එච්.ඩී.සී. හෙට්ටිආරච්චි මිය<br>NDT | **පර්යේෂණ ඉංජිනේරු**<br>**ඉංජිනේරු**<br>ඩී.එම්.ඒ.කේ. දිගල මිය<br>Special Apprentice (Civil Eng.), IESL(Part 1)<br>ඩබ්.ඒ.ඩී.එල්.එස්. කරුණාවර්ධන මයා<br>HNDE<br>පී.ඒ.යූ.ඩබ්.කේ. පරණගම්පොල මයා<br>NDES |
| | **නඩත්තු ඒකකය හා මධ්‍යම වැඩහල** |
| | **ඉංජිනේරු**<br>එන්.ඒ.ඩී.ඩී.ජේ. ප්‍රසන්න මයා<br>NDT<br>**පාලක - වැඩහල**<br>යූ.එස්. වර්ණකුල මයා<br>NDES |

| මානව සම්පත් දෙපාර්තමේන්තුව | මූල්‍ය දෙපාර්තමේන්තුව |
|---|---|
| **අධ්‍යක්ෂ (මානව සම්පත්)**<br>ඩී.ඒ.එම්. මුණසිංහ මිය<br>MBA (HRM), BSc (HRM), AM(CIPM) | **අධ්‍යක්ෂ (මූල්‍ය)**<br>ඩී.වී.එස්. පෙරේරා මිය<br>ICMA Professional Part II, IPFA, ICEA |
| **සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)**<br>ආර්. ගමගේ මයා<br>MA in Sociology, MLRHRM, BA (Social Sc.) Sp., | **ගණකාධිකාරී**<br>ජේ.එම්.ආර්.එස්. ජයසිංහ මයා<br>MBA, BBA Sp. , CPFA, ICASL – Prof. Part I |
| **තොරතුරු තාක්ෂණ අංශය** | **පුස්තකාලය** |
| **ජාල පරිපාලක**<br>බී.පී. වික්‍රමසූරිය මයා<br>BSc (Computing & Infor. Systems) | **පුස්තකාලයාධිපති**<br>ඩී.එම්.ටී.පී.කේ. දේවගිරි මිය<br>MSc, BA (Library Science) Sp., ASLLA |
| **අභ්‍යන්තර විගණන අංශය** | **ප්‍රසම්පාදන අංශය** |
| **අභ්‍යන්තර විගණක**<br>බී.පී. සුසන්ත මයා<br>MPM, HNDA | **සැපයුම් නිලධාරී**<br>ආර්.එච්.ඒ. ජීවානන්ද මයා<br>BSc (Physical Science) |

## 05 මානව සම්පත් කළමනාකරණය

ආයතනයක අරමුණු, පරමාර්ථ ළඟාකරගැනීමේදී එම ආයතනය සතු වටිනාම සාධකය මානව සම්පතයි. මෙවැනි නවෝත්පාදන යුගයක පර්යේෂණ ආයතනයක මානව සම්පත සුවිශේෂී වේ. මධ්‍යස්ථානයේ සිදු කරනු ලබන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන්, වාණිජ්‍ය ව්‍යාපෘතීන්, තාක්ෂණික සේවා සැපයීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම යනාදී මූලික කාර්යයන්හි සාර්ථකත්වය මුළුමනින්ම රඳා පවතිනුයේ දැනුම සහ නිපුණතා සපිරි කාර්ය මණ්ඩලය මතවේ. ඒ අතුරින් ඉංජිනේරු හා තාක්ෂණික කාර්ය මණ්ඩලය ප්‍රමුඛ වේ.

රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හි පවතින අඩු වැටුප් හා දීමනා හේතුවෙන් සුදුසුකම් ලත් ඉංජිනේරු පර්යේෂකයින් හා තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවාගැනීම සහ රඳවාගැනීම, මධ්‍යස්ථානයේ මානව සම්පත් කළමනාකරණයේදී මුහුණදී ඇති ප්‍රධාන ගැටළුව වේ. මෙම ගැටළුවට පිළියම් ලෙස පර්යේෂණ වැඩසටහන් සම්බන්ධව ජාතික ප්‍රතිපත්තියක් පැවතීම, පර්යේෂණ භාවිතයන් ජාතික සංවර්ධන කාර්යයන් සඳහා අදාළ කරගැනීම, ඉංජිනේරු පර්යේෂකයින් රාජ්‍ය අංශය සඳහා බඳවාගැනීමේදී පෞද්ගලික අංශයට සාපේක්ෂව තරගකාරී වැටුප් හා ප්‍රතිලාභ ලබාදීම, දේශීය හා විදේශීය වශයෙන් පුළුල් පුහුණු හා සංවර්ධන අවස්ථාවන් ලබාදීම යනාදී කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයකින් කටයුතු කරනු ලැබිය යුතු වේ.

කෙසේ වෙතත්, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවතින තත්වයන් හා සීමාවන් යටතේ ධාරිතා සංවර්ධන වැටසටහන් (උදා - උසස් අධ්‍යාපන අවස්ථාවන්/ පුහුණු හා සංවර්ධන අවස්ථාවන්/ ජාත්‍යන්තර වැඩමුළු සම්මන්ත්‍රණ සඳහා යොමු කිරීම යනාදිය) පහසුකම් සහිත වැඩ පරිසරයක් ඇතිකරලීම, රැකියා සංවර්ධන අවස්ථාවන් සඳහා පහසුකම් සළසාදීම යනාදී වූ විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කරමින් නිපුණතා සපිරි පර්යේෂකයින්, බඳවාගැනීම සහ ඔවුන් සේවයේ රඳවාගැනීම සඳහා වූ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනිමින් පවතී.

**මධ්‍යස්ථානයේ 2018 වර්ෂයේ** (2018.12.31 දිනට) **සමස්ථ කාර්යමණ්ඩල තොරතුරු සාරාංශය පහත පරිදි වේ.**

| සේවා ඛාන්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ඉහළ කළමනාකරණ මණ්ඩලය | 3 |
| ඉංජිනේරු කාර්ය මණ්ඩලය | 47 |
| විධායක කාර්ය මණ්ඩලය | 9 |
| කණිෂ්ඨ කළමණාකාර කාර්ය මණ්ඩලය | 11 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 20 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 52 |
| ප්‍රථමික මට්ටමේ කාර්ය මණ්ඩලය | 133 |
| එකතුව | **275** |



## 5.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

### 5.1.1 2018 වර්ෂය තුල සිදුකළ නව බඳවාගැනීම්

| | නම | තනතුර | සේවා කාණ්ඩය | බඳවාගත් දිනය |
|---|---|---|---|---|
| 1 | අයි.ආර්.ආර්.ටී. තත්සරණි මෙනවිය | පුස්තකාල සහායක | PL 1 | 2018.03.02 |
| 2 | යූ.එස්. වර්ණකුල මයා | පාලක - වැඩහල | JM 1-2 | 2018.03.15 |
| 3 | කේ.එන්. නවරත්න මයා | සැපයුම් නිලධාරී | MA 2-2 | 2018.03.26 |
| 4 | එම්.එම්.එම්. මනාස් මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.04.02 |
| 5 | කේ. සිවසුදන් මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.04.02 |
| 6 | එච්.එම්.එම්.ජී.ඒ.කේ.බී. මඩවලගේ මයා | සැළසුම් ශිල්පී | MA 2-2 | 2018.04.02 |
| 7 | බී.ජේ.ටී. කරුණාරත්න මයා | කාර්යාල සහායක | PL 1 | 2018.04.02 |
| 8 | කේ.ඒ.වී. ධනංජය මයා | කාර්යාල සහායක | PL 1 | 2018.04.02 |
| 9 | පී.පී.එස්.එම්.කේ. පොන්සේකා මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.04.25 |
| 10 | එච්.ඒ.කේ. හපුආරච්චි මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.05.03 |
| 11 | ඩබ්.ඒ.කේ. සංජීවනී මිය | කළමනාකරණ සහාකාර | MA 1-2 | 2018.08.01 |
| 12 | පී. තනෝජන් මයා | කළමනාකරණ සහාකාර | MA 1-2 | 2018.08.20 |
| 13 | ඩබ්.පී.එස්.ඕ. අබේවර්ධන මයා | විද්‍යුත් කාර්මික | PL 3 | 2018.08.20 |
| 14 | ඩී.එම්. ජයරත්න මයා | රිය සහායක | PL 1 | 2018.03.09 |
| 15 | කේ.ඒ.ඊ.එම්. කස්තුරිආරච්චි මයා | යන්ත්‍ර ශිල්පී | PL 3 | 2018.10.15 |
| 16 | එම්.එස්. දිල්ෂානි සිල්වා මයා | විද්‍යුත් කාර්මික | PL 3 | 2018.11.13 |

### 5.1.2 2018 වර්ෂය තුල සිදුකළ අභ්‍යන්තර බඳවාගැනීම්

| | නම | පැවති තනතුර | නව තනතුර | දිනය |
|---|---|---|---|---|
| 1 | බී.ඩී.ආර්. වාමිකා මිය | ගෘහ නිර්මාණ ශිල්පී (MM 1-1) | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ (AR 2) | 2018.12.21 |
| 2 | එස්.ඒ.පී. ශලින්ද මයා | පර්යේෂණ ඉංජිනේරු (AR 2) | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු (AR 2) | 2018.12.21 |

### 5.1.3 2018 වර්ෂය තුල සේවයෙන් විශ්‍රාම ගැනීම්

| | නම | තනතුර | සේවා කාණ්ඩය | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|---|---|
| 1 | ඩබ්.ඩී.කේ. ජයරත්න මයා | කම්කරු | PL - 3 | 2018.03.28 |
| 2 | බී.කේ. උපාලි රොද්‍රිගෝ මයා | කම්කරු | PL - 3 | 2018.03.28 |
| 3 | කේ.ඊ.ජේ. ප්‍රනාන්දු මයා | විද්‍යුත් කාර්මික | PL - 3 | 2018.07.15 |
| 4 | කේ.එම්.වී.එල්. පෙරේරා මයා | කම්කරු | PL - 3 | 2018.10.28 |

### 5.1.4 2018 වසර තුල සේවයෙන් ඉල්ලා අස්වීම්

| | නම | තනතුර | සේවා කාණ්ඩය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|
| 1 | ජී.එම්.සී.එම්. රාජකරුණා මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.01.05 |
| 2 | ආචාර්ය කේ.එම්.ඩබ්. රජවත්ත මිය | ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ | HM 1-.3 | 2018.01.22 |
| 3 | කේ.එස්.කේ.එම්.ආර්.ඒ.බී. ලේනවල මයා | පාලක - නඩත්තු | JM 1-2 | 2018.03.14 |
| 4 | ජෙ.පී.ජේ. ජයවික්‍රම මයා | අව්වූ සාදන්නා | PL - 3 | 2018.03.22 |
| 5 | එම්.ඩී.එච්. ප්‍රනාන්දු මයා | විදුලි කාර්මික | PL - 3 | 2018.05.31 |
| 6 | එම්. නිහාල් මයා | යන්ත්‍ර ශිල්පී | PL - 3 | 2018.07.01 |
| 7 | ජී.ජී.කේ.එච්. කෞෂල්‍යා මෙනවිය | කාර්මික සහකාර | MA 2-2 | 2018.07.01 |
| 8 | එච්.වයි.ඩී. රණසිංහ මයා | කාර්මික සහකාර | MA 2-2 | 2018.07.01 |
| 9 | ඊ.ජී. දිලාන් සුමින්ද මයා | යන්ත්‍ර ශිල්පී | PL - 3 | 2018.07.09 |
| 10 | පී.එල්.එස්. පෙරේරා මයා | කම්කරු | PL - 3 | 2018.07.20 |
| 11 | එම්.එල්.එස්.එස්.එස්. ගුණරත්න මයා | විදුලි කාර්මික | PL - 3 | 2018.08.15 |
| 12 | ඒ.ඒ.එන්.එස්. අධිකාරි මයා | පාලක - තාක්ෂණ උද්‍යානය | JM 1-2 | 2018.11.02 |
| 13 | ටී.ටී.එස්.ආර්. රොද්‍රිගෝ මයා | කාර්මික සහකාර | MA 2-2 | 2018.11.08 |
| 14 | පී.පී.එස්.එම්.කේ. පොන්සේකා මයා | පර්යේෂණ ඉංජිනේරු | AR 1 | 2018.11.19 |
| 15 | එම්.ජී.එන්. සඳනායක මිය | පොත් තබන්නා | MA 2-2 | 2018.12.01 |

## 5.2 කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමුඛ අවධානය යොමු කරමින් ඒ සඳහා වූ පහසුකම් අඛණ්ඩව සැපයීමට මධ්‍යස්ථානය විසින් නිරන්තර උත්සාහ ගනු ලැබේ. දැනුම, කුසලතා හා නිවැරදි ආකල්ප වර්ධනය කිරීම තුලින් නිපුණතා සපිරි ඵලදායී කාර්ය මණ්ඩලයක් නිරතුරුව මධ්‍යස්ථානය තුළ පවත්වාගැනීමට සෑම විටම ක්‍රියා කරනු ලැබේ. ඒ සඳහා ධාරිතාවය ගොඩනැංවෙන සහ දැනුම, කුසලතා, ආකල්ප, වර්ධනය කරලීමේ වැඩසටහන් සඳහා අදාළ කාර්යමණ්ඩලය යොමු කරවනුයේ ඔවුන්ගෙන් මධ්‍යස්ථානයට සිදුවන සේවාවන්, රාජාකාරී වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ලබාගැනීමේ අරමුණ මෙන්ම ඔවුන්ගේ පුද්ගල රැකියා සංවර්ධනයද ඉලක්ක කරගනිමිනි.

### 5.2.1 2018 වර්ෂයේදී නර්ඩ මධ්‍යස්ථානය කාර්ය මණ්ඩලය සළසාදී ඇති පුහුණුව හා සංවර්ධනය

| සේවා බෑන්ඩය | පුහුණු අවස්ථාවන් සංඛ්‍යාව |
|---|---|
| ඉහළ කළමනාකරණ | 3 |
| ඉංජිනේරු | 103 |
| විධායක | 61 |
| කණිෂ්ඨ කළමනාකරණ | 20 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 44 |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 64 |
| ප්‍රාථමික | 135 |
| **එකතුව** | **430** |




### 5.2.2 කාර්යස්ථානයෙන් බැහැරව සිදුකරනු ලැබූ නේවාසික පුහුණු හා සංවර්ධන වැඩමුළු

2018 වර්ෂය තුළදී පහත සඳහන් පරිදි කණ්ඩායම් දෙකක් ලෙස, ඌව කුඩා ඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ මෙහෙයවීමෙන් දින තුනක නේවාසික නායකත්ව පුහුණු වැඩසටහන් සඳහා කාර්යමණ්ඩලය සහභාගී කරවන ලදි.

2018 මාර්තු 09 -11 කාර්ය මණ්ඩලය 69 දෙනෙකු

2018 ජුනි 01- 03 කාර්ය මණ්ඩලය 65 දෙනෙකු

### 5.2.3 පශ්චාත් උපාධි / වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා පහසුකම් සැළසීම

| 2018 වසර තුල පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම් | | | | |
|---|---|---|---|---|
| | නම සහ තනතුර | සුදුසුකම | ආයතනය | සම්පූර්ණ කරන ලද දිනය |
| 1 | ආර්. ගමගේ මයා<br>සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | Master in Labouer Relations and HRM | කොළඹ විශ්වවිද්‍යාලය | 2018/03/01 |
| 2 | ඉංජි. ජේ.ඒ.සී. ක්‍රිෂාන්ති මිය<br>අධ්‍යක්ෂ (තාක්ෂණික) | M.Eng. Degree | මොරටුව විශ්ව විද්‍යාලය | 2018/06/01 |
| 3 | එස්.එම්.එස්.එස්.<br>සේනාරත්න මයා<br>පර්යේෂණ ඉංජිනේරු | M.Sc Eng Degree | මොරටුව විශ්ව විද්‍යාලය | 2018/07/01 |
| 4 | බී.පී. සුසන්ත කුමාර මයා<br>අභ්‍යන්තර විගණක | MPM Degree | SLIDA ආයතනය | 2018/07/02 |

| 2018 වසර තුල වරලත් ඉංජිනේරු සුදුසුකම් සපුරාලීම් | | | | |
|---|---|---|---|---|
| | නම | තනතුර | සාමාජිකත්වය | ආයතනය |
| 1 | ඉංජි. එස්.ඒ.පී.එස්. සිල්වා මයා | ජ්‍යෙෂ්ඨ<br>පර්යේෂණ ඉංජිනේරු | සාමාජිකත්වය | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය |

| 2018 වසර තුල තවදුරටත් කරගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවන් | | | | | |
|---|---|---|---|---|---|
| | නම සහ තනතුර | සුදුසුකම | ආයතනය | ආරම්භ කරන ලද දිනය | සම්පූර්ණ කිරීමට නියමිත දිනය |
| 1 | ජී.එස්.ආර්. කොස්තා මිය<br>පර්යේෂණ ඉංජිනේරු | M.Eng./PG Diploma Pro.in Energy Technology | මොරටුව විශ්වවිද්‍යාලය | 2016/02/06 | 2018/02/05 |
| 2 | බී.ඩී.පී.එස්. රණවීර මිය<br>පර්යේෂණ විද්‍යාඥ | M.Sc Degree Programme in Industrial and Environmental Chemistry 2016/18 | කැළණිය විශ්වවිද්‍යාලය | 2016/06/18 | 2018/06/17 |
| 3 | බී.පී. වික්‍රමසූරිය මයා<br>ජාල පරිපාලක | M.Eng./PG Diploma in Information Tech. -2016 | මොරටුව විශ්වවිද්‍යාලය | 2016/10/22 | 2018/10/21 |
| 4 | කේ.පී.ඩී.ඩී. ජයසේකර මයා<br>පර්යේෂණ ඉංජිනේරු | M.Eng./PG Diploma in Environmental Eng. & Mgt. | මොරටුව විශ්වවිද්‍යාලය | 2016/10/12 | 2018/10/21 |
| 5 | අයි.පී. බටුවිට මයා<br>පර්යේෂණ ඉංජිනේරු | PG Diploma/M.Eng in Highway &Traffic Eng. | මොරටුව විශ්වවිද්‍යාලය | 2015/02/28 | 2018/12/31 |
| 6 | ටී.කේ. ගීගනගේ මයා<br>පර්යේෂණ ඉංජිනේරු | M.Sc/PG Diploma Course in Sustainable Process Eng. | මොරටුව විශ්වවිද්‍යාලය | 2015/12/05 | 2018/05/30 |
| 7 | ඉංජි. ඒ ජී.ඒම්.ටී. සිරිවර්ධන<br>මෙනවිය<br>ජ්‍යෙෂ්ඨ පර්යේෂණ ඉංජිනේරු | PhD Studites of Engineering and Computer Sciences | Australian National University | 2017/11//01 | 2021/10/31 |

### 5.3 විදේශ ශිෂ්‍යත්ව/ සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන්/ වැඩමුළු සඳහා සහභාගී වීම

| | නම සහ තනතුර | වැඩසටහන | රට | කාලපරිච්ඡේදය |
|---|---|---|---|---|
| 1 | පී.එන්.ඩී. පතිරණ මිය<br>සහකාර අධ්‍යක්ෂ<br>(අලෙවි) | International Workshop on "Technological Innovation and Management for Sustainable Development | ඉන්දියාව | 2018/03/27 -28 |
| 2 | ඉංජි. ඩබ්.ජේ.එල්.එස්.<br>ප්‍රනාන්දු මයා<br>සභාපති | The meeting of Senior Officials of SCO Member States and the Meeting of Heads of Ministries and Authorities of Science and Technologies of SCO Member States | රුසියාව | 2018/04/17 -19 |
| 3 | ඉංජි. ඩබ්.ජේ.එල්.එස්.<br>ප්‍රනාන්දු මයා<br>සභාපති | Second Session of the Committee on Information and Communications Technology, Science, Technology and Innovation | තායිලන්තය | 2018/ 8/27-31 |

## 5.4 කාර්යස්ථ පුහුණු වැඩසටහන් සංවිධානය

| | පුහුණු වැඩසටහන | දිනය | සේවා බාණ්ඩයන් | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | සේවක අභිප්‍රේරණ වැඩසටහන | 2018.02.02 | කළමකාරණ සහකාර සහ ප්‍රාථමික සේවා බාණ්ඩ | 123 |
| 2 | අකුණුවලින් ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව | 2018.08.28 | ඉහළ කළමකාරණ, කළමනාකරණ, අධ්‍යයන පර්යේෂණ, කාර්මික සහකාර | 41 |
| 3 | Speech Craft Programme | 2018.09.12-2018.12.05 | ඉහළ කළමකාරණ, කළමනාකරණ, අධ්‍යයන පර්යේෂණ, කාර්මික සහකාර, කළමනාකරණ සහකාර | 30 |

## 5.5 අනෙකුත් ප්‍රධාන සමාජ සත්කාරක සේවාවන් - 2018

**ආධුනිකයින් සඳහා වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් සළසාදීම**

විශ්වවිද්‍යාල හා පිළිගත් වෘත්තීය/කාර්මික පුහුණු ආයතනයන් විසින් යොමු කරනු ලැබූ ආධුනිකයින් 51 දෙනෙකු සඳහා මාස 3/ මාස 6 සහ වසරක වැනි කාල පරිච්ඡේදයන්ට අදාළව වෘත්තීය/ කාර්මික පුහුණු අවස්ථාවන් 2018 වර්ෂය තුල සළසාදී ඇත.

# 06 2018 වර්ෂයේදී කාර්යසාධනය පිළිඹිමු කිරීම

ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ සංවර්ධන කටයුතු මගින් එක්සත් ජාතින්ගේ තිරසාර ඉලක්කයන් හා රජයේ සංවර්ධන සැලැස්මට හා අනුකූලවන සේ ජලය, වාරිමාර්ග, බලශක්තිය, පරිසරය හා පිරිමැසුම්දායක ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණය හා සම්බන්ධ පර්යේෂණ කටයුතුවල නියැලෙනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා ජනතාවගේ සුබ සිද්ධිය සඳහා මහ පාදන අන්දමේ නිපැයුම් හා තාක්ෂණයන් හඳුන්වාදීමේ ක්‍රියාවලියක අප ආයතනය නිරන්තරයෙන්ම නිරත වේ. පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට අමතරව පාරිසරික හා බලශක්ති කළමනාකරණයට අදාල වූ තාක්ෂණික සේවාවන් ද, ජීවවායු තාක්ෂණය, අදාහනාගාර තාක්ෂණය, භෂ්මාගාර තාක්ෂණය, යන්ත්‍ර වැඩිදියුණු කිරීම්, ගොඩනැගිලි හා පාලම් ඉදිකිරීම් වැනි අංශ ඔස්සේ වූ වානිජමය සේවාවන් වලද නිරත වේ. වාර්ෂික පර්යේෂණ සමුළුව හා වාර්ෂික විවෘත ප්‍රදර්ශනය යනු අපගේ ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාත්මක කරණු ලබන ක්‍රමවේදයන්ය.

විද්‍යා දැනුම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරණු ලබන පාසල් සිසුන් වෙනුවෙන් සැලසුම් කරණ ලද විද්‍යා දැනුම පාදක කරගත් නේවාසික පුහුණු කඳවුරු හා කර්මාන්ත හා සම්බන්ධ නිලධාරීන්ගේ පෞරුෂත්වය හා ඵලදායිතාවය ඉහළ නැංවීමට සඳහා සැලසුම් කරන ලද විශේෂ පුහුණු කඳවුරු ද අප ආයතනය මගින් පවත්වනු ලැබේ.

## 6.1 2018 වසරේ නිම කරන ලද ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති පහත දැක්වේ.

### 6.1.1 සෙවිලි උළු වියලීමේ යන්ත්‍රය

උළු පිලිස්සීමට පෙර උළුවල තෙතමනය වියලීම මගින් ක්‍රමානුකූලව අඩුකර ගත යුතු වේ. දැනට භාවිතා කරණු ලබන ස්වභාවික වියලුම් ක්‍රම අතරතුරදී උළු ප්‍රමාණයෙන් 20%ක් පමණ ඇදවීම් වලට භාජනය වී ඉවත් කිරීමට සිදු වේ. ඊට අමතරව වර්ෂාව සහිත දින වලදී වියලීමට යන කාලය දින 8-12 ක් පමණ වේ. ඉවත් කරණ උළු (rejects) ප්‍රමාණය අඩු කිරීම හා වියලීමට ගතවන කාලය අඩුකිරීම අරමුණු කොටගෙන සෙවිලි උළු වියලීමේ යන්ත්‍රයක් සැලසුම්කොට ඉදිකරණු ලැබ ඒ හා සම්බන්ධ වූ අත්හදා බැලීම් ද සිදු කරණ ලදී. මෙහිදී අපතේ යන උළු ප්‍රතිශතය 1%-2% දක්වා අඩු කිරීමට හා වියලුම් කාලය දින දෙකක් දක්වා අඩුකරගැනීමට හැකි බව ප්‍රායෝගිකව තහවුරු කරගන්නා ලදී.



*උළු වියලීමේ යන්ත්‍රය*

### 6.1.2 ප්‍රජාවක් වෙනුවෙන් කරණ ලද ක්‍රමෝපායන් කිහිපයක්ම අන්තර්ගත වූ කසල කළමනාකරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සඳහා කොත්මලේ ජල විදුලිබලාගාරයේ සේවක පරිස සඳහා වූ ගම්මානය තෝරාගන්නා ලදී. නිවාස 75කින් සමන්විත වූ ගම්මානය සඳහා කසල වෙන්කර එකතු කිරීම සඳහා බඳුන් ද, සීඝ්‍රයෙන් දිරාපත් වන කසල අපහරණය කිරීම සඳහා ජීවවායු ජනක දෙකක් ද, භාවිතයට ගත නොහැකි හා දහනශීලී අපද්‍රව්‍ය සඳහා භෂ්මාගාරයක්ද ඔවුන් වෙත ලබාදී ඒ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් ද පවත්වන ලදී. ගම්පොළ නගරසභාව හා සාකච්ඡා කොට වෙන් වෙන්ව එකතු කරණ ලද අපද්‍රව්‍ය (වීදුරු ලෝහ හා ප්ලාස්ටික්) වරින්වර ඉවත් කිරීමට ද පියවර ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය දියත් කරණු ලැබුවේ ආදර්ශ ව්‍යාපෘතියක් ලෙසය.





*කොත්මලේ ජල විදුලිබලාගාරයේ ඉදිකරන ලද ජීවවායුජනක*

### 6.1.3 නර්ඩ් ආදාහනාගාර තාක්ෂණය වැඩිදියුණු කිරීම

නර්ඩ් ආයතනය මගින් ආදාහනාගාර තාක්ෂණය අප රටට හඳුන්වා දෙනු ලැබුවේ වර්ෂ 1990දී පමණය. ඉන් පසුව ක්‍රමයෙන් එම තාක්ෂණය ප්‍රචලිත වී මේ වන විට නර්ඩ් තාක්ෂණය අනුව වූ ආදාහනාගාර 200ක් පමණ දිවයින පුරා ඉදිකරණු ලැබ ඇත.

මෙම වැඩි දියුණු කිරීම් සිදු කරණු ලබන්නේ දහනයේදී පිටවන දුම මගින් සිදුවිය හැකි පාරිසරික හානිය තවදුරටත් අවම කරගැනීම සඳහා ය (දියුණු විදේශීය රටවල් වල නිර්නායකයන් හා ගැලපෙන අයුරින්). මෙම තාක්ෂණයේ විශේෂිත ලක්ෂණ ලෙස යන්ත්‍රය, දහන කුටීර දෙකක් යුක්ත වීම, තාප හුවමාරුවක් යොදාගෙන දුම හා පිටවන තාපයෙන් කොටසක් නැවතත් ප්‍රයෝජනයට ගැනීමට ආදිය දැක්විය හැකිය. මෙම ව්‍යාපෘතිය 2019 ජූලි මසදී සම්පූර්ණ කිරීමට නියමිතය.





*ආදාහනාගාර කුටීරය*

### 6.1.4 කුඩා දර කැබලි භාවිතාකර තේ වියලුම් දාහකය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

දාහකය වෙත දරකොට ඇතුලත්කර භාවිතා කිරීම සාම්ප්‍රදායික ක්‍රමය වුවද, එවිට සිදුවන උෂ්ණත්ව විචලනයන් නිසා නිෂ්පාදිත තේ වල ගුණාත්මක භාවය අඩු වීමය. කුඩා දර කැබලි ක්‍රමානුකූලව ඇතුළු කිරීමට සැලැස්වීමෙන් මෙම තත්වය මහ හරවා ගත හැකි බව පර්යේෂණාත්මකව තහවුරු කරගනෙ ඇත. **හේලයික** ඉස්කුරුප්පුවක් මඟින් ලී කැබලි ඉදිරිපසට යැවීමටද තවත් විශේෂිත උපකරණ ද භාවිතාකර **පාලිත** දහනයක් ලබාගැනීමට අපේක්ෂිතය.



*දර ඇතුළු කිරීමේ යන්ත්‍රය අත්හදා බැලීම*

### 6.1.5 වැඩි පීඩනයක් යටතේ වූ ඔක්සිජන් වායුව පමණක් අඩංගු කුටීරය සැලසුම් කොට නිර්මාණය කිරීම

මෙම කුටීරය සුවකළ නොහැකි හෝ සුව කිරීමට ඉතා අපහසු තුවාල ඇති රෝගීන්ව සුවකිරීම සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී වායුගෝලීය පීඩන 2-3 ක් අතර පීඩනයක් ඇතිව ඔක්සිජන් වායුව පමණක් ඇති කුටීරයක් අවශ්‍ය වේ. මෙම තත්වයන් තුවාල සුව කිරීමට ඉතා හිතකර වේ. කුටීරය සාදා නිම කර ඇති අතර අවශ්‍ය පීඩන රඳවාගැනීම සඳහා වැඩි දියුණු කිරීම් සිදුකරමින් පවතී.



*ඔක්සිජන් වායුව පමණක් අඩංගු කුටීරය*

### 6.1.6 පොල් කර්මාන්තය සඳහා යන්ත්‍ර සූත්‍ර වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ මිනිස් ශ්‍රමයෙන් ක්‍රියාකරණු ලබන පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රයක් යාන්ත්‍රිකව සහ පහසුවෙන් පොල් කැඩීමට හැකි පොල් කෙක්කක් හඳුන්වාදීමට බලාපොරොත්තු විය. මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරණු ලබන යන්ත්‍ර හා යාන්ත්‍රික යන්ත්‍රය දැනට සාදා නිම කර ඇති අතර ද ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරණු ලැබ ඇත. මෙහිදී මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරණ යන්ත්‍රය සාර්ථක වී ඇති අතර, එය තාක්ෂණය පැවරීමේ ක්‍රියාවලියකට යොමු කරණු ලැබ ඇත. කර්මාන්තමය යන්ත්‍රය සඳහා සුළු වෙනස්කිරීම් කිහිපයක් පමණක් සිදුකිරීමට නියමිතය.



*අතින් ක්‍රියාකරණු ලබන පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රය*



*යාන්ත්‍රිකව පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රය*

### 6.1.7 කොහු ලණු ගෙතුම් /විවීමේ යන්ත්‍රය

කොහු ලණු ආශ්‍රයෙන් ලණු ගෙතුම් සැකසීමේ යන්ත්‍රයක් නිපදවීම ව්‍යාපෘතියේ අරමුණයි. දෙවනුව එම ලණු ගෙතුම් ලණු පාපිසි හා පැදුරු විවීමට යොදා ගැනේ. ලණු ගෙතුම් නිපදවීම සඳහා ලණු පැදුරු කර්මාන්තයේ මුළු කම්කරු ශ්‍රමයෙන් 60%ක් පමණ වැය වේ. යන්ත්‍රානුසාරයෙන් මෙය ටස කල හැකිනම් මෙම කර්මාන්තයේ ඵලදායිතාවය ඉහල නැංවිය හැකි අතර එමගින් ලණු පැදුරු අපනයනය කිරීමේ කර්මාන්තයේ ඵලදායිතාවය ඉහල නැංවිය හැකිය.
මේ වන විට යන්ත්‍රය සැලසුම් කොට නිපදවා ඇති අතර වැඩිදියුණු කිරීම් කිහිපයකට භාජනය කොට ඇත.



*ලණු ගෙතුම්/ විවීමේ යන්ත්‍රය*

### 6.1.8 ස්ලිප් ෆෝම් බිත්ති යන්ත්‍රානුසාරයෙන් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ අර්ධ ස්වයංක්‍රීය ලෙස කපරාදුවක් අවශ්‍ය නොවන සේ ස්ලිප් ෆෝම් බිත්තිය ඉදිකිරීමයි.

2017 වසරේදී මෙම ව්‍යාපෘතිය නිම කරණ ලද අතර යන්ත්‍රය ක්‍රියාකරවීමේ පහසුව ඉහල නැංවීම සඳහා නව යන්ත්‍රයක් හඳුන්වා දෙනු ලැබ ඇත.



*ස්ලිප් ෆෝම් බිත්ති බැඳීමේ යන්ත්‍රය*

### 6.1.9 අමු තේ පත්‍ර මතුපිට තෙතමනය මැනීමට ක්‍රමයක් හඳුන්වා දීම

අමු තේ පත්‍ර සපයන්නේ හිතාමතාම පත්‍ර වලට ජලය එකතු කරති (බර වැඩිවීම). ඒ අනුව පත්‍ර වියලීමේදී වැඩි වියදමක් දැරීමට සිදුවේ.

තේ මණ්ඩලයේ ඉල්ලීමකට අනුව මෙම යන්ත්‍රය නිමවා ඇත. ක්ෂේත්‍ර පරීක්ෂණයන් හා වැඩිදියුණු කිරීම් ඉදිරියේදී කිරීමට නියමිතය.



*අමු තේ පත්‍ර මතුපිට තෙතමනය මැනීමේ යන්ත්‍රය*

### 6.1.10 එම මොහොතේදී නිරීක්ෂණය කරණු ලැබීමට සහ ජායාරූප ගැනීමට හැකි ආරක්ෂක රොබෝව

මෙම ව්‍යාපෘතියට අනුව ස්වයං පාලනයකින් එහා මෙහා යා හැකි ඉඛේම ආරෝපනය වන wifi පද්ධතියක් හරහා ජංගම දුරකථනයකට අනතුරුව සංඥා නිකුත් කළහැකි රොබෝවක් ගෙවත්තේ ආරක්ෂක කටයුතු සඳහා භාවිතා කිරීමයි. මේ වන විට ව්‍යාපෘතියේ 45% ක් අවසන් වී ඇත.




*wifi පද්ධතියක් හරහා ජංගම දුරකථනයකට සංඥා නිකුත් කළහැකි රොබෝව*



*පර්යේෂණ සඳහා නිම කරණ ලද රොබෝව*

### 6.1.11 ආරෝග්‍යශාලාවල රසායනාගාර වාර්තා හා සාම්පල වායු පුරවන ලද නල ඔස්සේ යැවීමේ පද්ධතියක් නිර්මාණය කිරීම.

කොළඹ ජාතික රෝහලේ සාම්පල හා වාර්තා එහාමෙහා ගෙනයාම සඳහා කම්කරුවන් 200ක් පමණ යොදාගැනේ. රෝහල් බලධාරීන්ගේ ඉල්ලීම අනුව මෙම කාර්යය වඩාත් කාර්‍යක්ෂමව කරගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ජාතික රෝහල හා එක්ව ආරම්භ කරණ ලදී. මේ වන විට ව්‍යාපෘතියෙන් 60%ක් පමණ සම්පූර්ණ කරණු ලැබ ඇත.





*රසායනාගාර වාර්තා හා සාම්පල වායු පුරවන ලද නල ඔස්සේ යැවීමේ පද්ධතිය*

### 6.1.12 වීදි ලාම්පු පාලනය කිරීමේ පද්ධතිය



වීදී ලාම්පු අනවශ්‍ය වේලාවන්හිදී ක්‍රියාකිරීම නිසා බලශක්තිය අපතේ යයි. මෙම ලාම්පු ස්වයංක්‍රීයව පාලනය කිරීමේ පද්ධතිය ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා පෞද්ගලික විදුලිබල සමාගම, ඉංජිනේරු ආයතනය හා නර්ඩ් ආයතනය එක්ව ආරම්භ කරණු ලැබේ. මෙම තත්වය වලක්වා ගැනීම උදෙසා මෙම පද්ධතියේ ක්‍රියාකාරිත්වය අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් නිකුත් කරණු ලබන ශබ්ද තරංගයන් ආධාරයෙන් අවශ්‍ය විට විදුලි පහන් පද්ධතිය අක්‍රිය කල හැක.
මෙම පද්ධතියේ ආකෘතියක් දැනට සාදා නිමකර ඇති අතර සත්‍ය පද්ධතිය නිපදවමින් පවතී.

### 6.1.13 නිවාසවල බල ශක්තිය වැයවීම කාර්යක්ෂමව කිරීම සඳහා වූ ස්වයංක්‍රීය පද්ධතිය

මෙම ව්‍යාපෘතිය යටතේ නිවසේ සියලුම විදුලි උපකරණ බලශක්ති පරිභෝජනය අධික්ෂණය කළ හැකි වන පරිදි මුද්‍රිත විදුලි පරිපථ පුවරු සැකසීකරණ ලැබේ.

මුද්‍රිත විදුලි පරිපථ පුවරු සැකසීම ස්වයංක්‍රීය පාලනය වන ආලෝක පද්ධතිය පිළිබඳ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.




*මුද්‍රිත විදුලි පරිපථ පුවරු සැකසීම ස්වයංක්‍රීය පාලනය වන ආලෝක පද්ධතිය*

### 6.1.14 සැහැල්ලු සහ ලාභදායක සෙවිලි උළු කැටයක් නිර්මාණය කිරීම

සෙවිලි තහඩු සම්බන්ධයෙන් වර්තමානයේ උද්ගතවී ඇති තත්වය යටතේ අඩු වියදමින්, සැහැල්ලු උළු කැටයක් නිර්මාණය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරණු ලැබීය. පස් සහ සිමෙන්ති මිශ්‍රණයක් යොදාගෙන උළු සාම්පල කිහිපයක් සාදා මේ වන විට ඒ සම්බන්ධයෙන් යම් යම් පරීක්ෂාවන් කරණු ලැබේ.





*නිර්මාණය කරණ ලද සැහැල්ලු උළු කැට*

### 6.1.15 ගල් අඟුරු දහනය කිරීමේදී හමායන අළු සිමෙන්ති යොදාගෙන ස්ථාවර සම්පීඩිත පස් ගලක් නිර්මාණය කිරීම

මෙම යන්ත්‍රයේ අරමුණ නම් නුසුදුසු පස්වල ගුණාත්මක අගය සිමෙන්ති හා හමායන අළු යොදාගෙන වැඩිදියුණුකර ස්ථාවර පස්ගලක් නිර්මාණය කිරීමයි.

විදුලිබල මණ්ඩලයේද ඉල්ලීම මත හමා යන අළු යොදාගෙන පසේ තත්වය වැඩි දියුණු කොට, සංයුතිය වෙනස් කරමින් පස්ගල් වර්ග කිහිපයක්ම සාදා අත්හදා බලමින් පවතී.



*හමා යන අළු යොදාගෙන නිෂ්පාදනය කරණ ලද පස්ගල්*

## 6.2 නියමු ව්‍යාපෘති

නියමු ව්‍යාපෘති සම්පූර්ණ කර ඇත්තේ මධ්‍යස්ථානය මගින් දියුණු කල නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර සහ ඒවායේ තාක්ෂණ ශිල්ප ක්‍රියාවලියන් පදනම් කොට ඒවායේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පැහැදිලි කිරීම, වැඩිදුර ඉගෙනීම සහ ජනතාව අතර ප්‍රකට කිරීමේ පදනම මතය. 2018 වර්ෂය තුල පහත සඳහන් නියමු ව්‍යාපෘති සම්පූර්ණ කර ඇත.

### 6.2.1 පාලම් ඉදි කිරීම්



### 6.2.2 වාහන නැවැත්වීමේ / ගාල් කිරීමේ සුහුරු පද්ධතිය (SMART Parking System)

කාර්යක්ෂම, බුද්ධිමත්ව සහ පරිසරයට සරිලන ලෙස සුපිරි වාහන නැවැත්වීමේ පද්ධතියක් සකස් කිරීම මෙහි අරමුණයි.

2017 වර්ෂයේ මැද භාගයේ පැවති පාර්ශවකරුවන්ගේ රැස්වීමට අනුව මෙම ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර පරීක්ෂා සඳහා රාජගිරියේ ජනජය නගරයේ පිහිට වූ මෙම තාක්ෂණය බෙදා හැරීමට ජැට් පුද්ගලික සමාගම තෝරා ගන්නා ලදි.

එම දායකයාගේ අවශ්‍යතාවයට අනුව මෙම වාහන නැවැත්වීමේ පද්ධතිය වැඩිදියුණු කර කොටස් 100 න් යුත් නැවතීමේ පහසුකම් සහිත වූ පද්ධතිය සඳහා නිස්තර සන්නිවේදන ක්‍රමයක් පිලිසකර කරන ලදි.





### 6.2.3 වියදම් පිරිමැසුම්දායක රැඳවුම් බැම්ම ඉදිකිරීම සඳහා වූ නියමු ව්‍යාපෘති

මධ්‍යස්ථානය රැඳවුම් බැම්ම ඉදිකිරීම සඳහා වියදම් පිරිමැසුම්දායක ක්‍රම 2ක් සොයා ගෙන ඇත. ඒවා නම් සම්ප්‍රදායක කලුගල් බැම්ම සහ වැරගැන්වූ කොන්ක්‍රීට් පැති බැම්ම වෙනුවට පෙරසවි කොන්ක්‍රීට් පැති බැම්ම සහ පෙරසවි මේසනරි පැති බැම්ම වේ.





### 6.2.4 නියමු ව්‍යාපෘතියක් ලෙස දුම්ගැසූ මාළු සැකසුම් යන්ත්‍රය

ශ්‍රී ලංකාවේ පාරිභෝගික ඉල්ලුම් ලුණු දැමූ මාළුවලට වඩා දුම්ගැසූ මාළුවලට වැඩිය. වැඩි දියුණු කල මෙම ක්‍රියාවලිය ගුණාත්මක බවින් වැඩි වන අතර එහි පිලිකාරක පොලිසයික්ලික් ඇරොමැටික් හයිඩ්‍රොකාබන් නොමැත. මෙම ව්‍යාපෘතිය ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය සමඟ ආරම්භ කරන ලදි.





### 6.2.5 ප්‍රජාව පදනම් කොටගත් කොත්මලේ අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

ශ්‍රී ලංකාවේ අපද්‍රව්‍ය බැහැර කිරීම පදනම් කොට කුඩා ප්‍රජාවක් සඳහා ප්‍රදර්ශන ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය.

### 6.2.6 නියමු ගෘහස්ථ ජීව වායු ජනක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මාර්ග දෙපසට පැමිණෙන කුණු කසළ නැවැත්වීම සහ ගෘහස්ථ ඉවුම් පිහුම් සඳහා ජීව වායුව සහ ගෘහස්ථ කාබනික පොහොර සඳහා දියර පොහොර උත්පාදනය කිරීමයි.

### 6.2.7 පොල් කර්මාන්තය සඳහා යන්ත්‍රෝපකරණ හා උපකරණ සංවර්ධනය කිරීම

පොල් අස්වැන්න කැඩීම හා ලෙලි ගැසීම ඉතා දුෂ්කර කාර්යයකි. වර්තමානයේ පවතින ශ්‍රම හිඟය පොල් කර්මාන්තයේ ප්‍රධාන ගැටළුවක් වන අතර, අස්වනු නෙලීමේ හා පොල්ලෙලි ගැසීමේ කටයුතු වලදී මෙය බෙහෙවින් බලපායි. නර්ඩ ආයතනය පොල් කර්මාන්තය සඳහා පැයට පොල් ගෙඩි 1200 ක් ලෙලිගැසිය හැකි සහ 2% ක් පමණ අපතේ යන ප්‍රමාණය අවම කරමින් පොල් කර්මාන්ත කරුවන් සඳහා යන්ත්‍ර නිෂ්පාදනය කර ඇත.

## 6.3 ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා උපදේශක සේවා

### 6.3.1 මහියංගන විද්‍යාත්‍ය ගොඩනැගිල්ල ඉදිකිරීම

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි නර්ඩ ආයතනයෙහි සංවර්ධන හා ව්‍යාපෘති දෙපාර්තමේන්තුව මහියංගනයෙහි විද්‍යාත්‍ය සම්පත් මධ්‍යස්ථානයේ සැලසුම් හා ඉදිකිරීම් කටයුතු භාර ගන්නා ලදී. මෙය කාර්යාල පහසුකම්, පරිගණක කාමරය සහ ශ්‍රවණාගාරය සහිත දෙමහල් ගොඩනැගිල්ලකි. බිම් ප්‍රමාණය - වර්ග මීටර 184.65 සහ මුදල - රු. මිලියන 9.69





### 6.3.2 රාජ්‍ය අමාත්‍ය නිල නිවාසයෙහි අලුත්වැඩියා කටයුතු

ගරු අමාත්‍යතුමාගේ නිල නිවාසය අලුත්වැඩියා කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන් අසාර්ථක උත්සාහයන් දැරීමෙන් පසු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යවරයා විසින් මෙම කාර්‍ය නර්ඩ නර්ඩ ආයතනය වෙත පවරණ ලදි. අලුත්වැඩියා කටයුතු සඳහා මුළු මුදල රු.4,343,570.00 කි.

### 6.3.3 කටුගොඩ, ලුනුවිලවත්ත පෙරසවි කොන්ක්‍රීට් පාලම ඉදිකිරීම

5'-6 "පළල සහ 30'-0' 'දිගකින් යුත් පෙරසවි කොන්ක්‍රීට් අඩි පාලම ඉදිකරන ලද්දේ කටුගොඩ ප්‍රදේශයේ ලුනුවිලවත්තෙහි නර්ඩ කාර්ය මණ්ඩලයේ සෘජු මැදිහත්වීමෙනි. දකුණු පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අඩි පාලම නිම කිරීම සඳහා රු. 890,970.00 ක අරමුදල් ලබා දෙන ලදී.





මෙයට අමතරව, කෑගල්ල දිස්ත්‍රික්කය සඳහා පෙරසවි කොන්ක්‍රීට් අඩි පාලම් 08 ක් ද ඉදිකරන ලදි. මෙහි තිපාදන ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව සහ යෞවන කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අධිකාරිය මගින් දරණ ලදී.

| ස්ථානය | මිණුම් | ඇස්තමේන්තුගත මුදල |
|---|---|---|
| දෙහිමාදුව, මාවනැල්ල | මීටර් 6.15 x මීටර් 1.575 | 884,000.00 |
| දුනුකවෙල අසල දීදිනියා කුම්බුර, දුනුකවෙල, රඹුක්කන | මීටර් 3.60 x මීටර් 1.575 | 758,000.00 |
| බුලත්කොහුපිටිය, අලවතුර, ගනේගොඩ, රංගල්ල | මීටර් 9.10 x මීටර් 1.70 | 1,490,500.00 |
| දොරනෑව ඔය, මාගල කනුහේන්තෙන්න පෙරුපල්ල විහාර මාවත, මාගල, දෙරනියගල | මීටර් 9.15 x මීටර් 2.10 | 1,912,280.00 |
| වාඩියාතෙන්න, කොටගොඩ පාර, දම්බුලුවාව, මාවනැල්ල | මීටර් 7.75 x මීටර් 1.575 | 1,239,875.00 |
| පාණ්දෙනිය ඇල, කුමාරපුර, අරනායක | මීටර් 5.10 x මීටර් 1.725 | 1,119,780.00 |
| මුවපිටිය මහා විද්‍යාල පාර, කොටගම, රඹුක්කන | මීටර් 3.60 x මීටර් 1.575 | 1,119,780.00 |
| කොටලවත්ත ඇල පාලම, තිබිරිපොල, දෙහියෝවිට | මීටර් 9.00 x මීටර් 1.575 | 1,754,425.00 |

### 6.3.4 ඉනාමලුව, මාතලේ දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ මෝටර් රථ වැඩමුළු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු

මෙම ගොඩනැගිල්ල මීට වසර 20 කට පමණ පෙර බලපත්‍රලාභී කොන්ත්‍රාත්කරුවෙකු විසින් නර්ඩ තාක්ෂණය යොදාගෙන ඉදිකරණ ලද්දකි. ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු, නඩත්තු කටයුතු හා පෙරනිමි කොන්ක්‍රීට් කාප්ප සම්බන්ධ ගැටළුව නර්ඩ තාක්ෂණය යොදාගෙන රු. 222,340.00 ක වියදමක් දරා සිදුකරණ ලදී.





### 6.3.5 විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ තාක්ෂණ හුවමාරු අංශය සිදු කල අභ්‍යන්තර වැඩ කටයුතු

තාක්ෂණික හුවමාරු අංශයට අයත් අභ්‍යන්තර වැඩ කටයුතු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම පරිදි නර්ඩ ආයතනය විසින් සිදු කරන ලදී. රු. 4,879,790.00 ක වියදමින් ඉහත ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ සැලසුම්, සහ ඊට අනුරූප ගෘහ භාණ්ඩ, ඉදිකිරීම් කටයුතු, විදුලි ස්ථාපන කටයුතු ඇතුළු පිරිසැකසුම් කිරීම මාස 2 ක කාලයක් තුළ සම්පූර්ණ කරන ලදී.

### 6.3.6 පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පවතින පර්ගෝලා තලාදවල ප්‍රතිසංස්කරණ කටයුතු

පේරාදෙනිය රාජකීය උද්භිද උද්‍යානයේ පර්ගොලා ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ කටයුතු නර්ඩ ආයතනය විසින් පෙරසවි කොන්ක්‍රීට් උපාංග භාවිතා කරමින් රු. 1,832,988.00 ක වියදමින් සිදු කරන ලදී.





## 6.4 ආදාහනාගාර, ජීවවායු ජනක සහ වෙනත් ඉදිකිරීම් සඳහා උපදේශක සේවා සැපයීම්

| | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 01 | ජීව වායුව ජනක ඉදිකිරීම, බෝයිස් ටවුන්, දියගල | 1,290,242.00 |
| 02 | ජීව වායුව ජනක ඉදිකිරීම, ආයුර්වේද රෝහල, අනුරාධපුරය | 459,184.00 |
| 03 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ජීවවායු ජනක සඳහා උපදේශක සේවා ලබාදීම | 68,173.00 |
| 04 | උඩුබද්දාව ආදාහනාගාරයේ අළුත්වැඩියා කටයුතු | 605,000.00 |
| 05 | මීගමුවේ ආදාහනාගාරය අළුත්වැඩියා කටයුතු | 314,000.00 |
| 06 | හබරාදුව ආදාහනාගාරය අළුත්වැඩියා කටයුතු | 840,000.00 |
| 07 | අම්බලංගොඩ යූ.සී. හි ආදාහනාගාරය අළුත්වැඩියා කටයුතු | 1,756,000.00 |
| 08 | දුම් මාළු ඒකකය පිරිසැකසුම් කටයුතු | 701,000.00 |
| 09 | ගෙවීම් සහතිකය සඳහා ලෝහ කැබලි පරීක්ෂා කිරීමේ කටයුතු | 21,870.00 |
| 10 | කුඩු කිරීමේ යන්ත්‍ර සැකසීම | 995,800.00 |
| 11 | හයිඩ්‍රොලික් ජැක් එකක් මගින් ක්‍රියාකරණ තෙල් / යුෂ නිස්සාරකය යන්ත්‍රයක් සෑදීම | 300,000.00 |

### 6.4.1 දියගල බෝයිස් ටවුන් හි ජීව වායු ජනකයක් ඉදිකිරීම

දියගල බෝයිස් ටවුන්හී ඌරු කොටු හා කිරි ගොවිපල සඳහා ජීවවායු ජනක ඉදිකිරීමට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ඇස්තමේන්තුගත මුදලින් 70% ක් සහ දියගල බෝයිස් ටවුන් හි කළමනාකාරිත්වයේ ඇස්තමේන්තුගත මුදලින් 30% ක සහයෝගිතා අරමුදලින් සිදුකරණ ලදී. ධාරිතාව - 38 $M^3$ • පෝෂණ ද්‍රව්‍ය - ගව ගොම සහ ඌරු අපද්‍රව්‍ය වේ.



දියගල - බෝයිස් ටවුන්හි ජීව වායු ජනකය





ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි ජීව වායු ජනකය

### 6.4.2 අනුරාධපුර ආයුර්වේද රෝහලේ ජීව වායු ජනකයක් ඉදිකිරීම

අනුරාධපුර ආයුර්වේද රෝහල සඳහා අනවර්ත වර්ගයේ ජීවවායු ජනකය ඉදිකිරීම සඳහා ඇසට්ලයින් ලීසිං සමාගම විසින් රු. 528,061.22 ක මුළු ඇස්තමේන්තුගත මුදල සපයන ලදී. ජනකයේ ධාරිතාව 20 $M^3$ වේ. පෝෂණ ද්‍රව්‍ය යනු රෝහල් පරිශ්‍රයේ ජනනය වන ආහාර අපද්‍රව්‍ය වන අතර රෝහලට අවශ්‍ය වන ඖෂධ සෑදීමට මෙම ජීවවායු ජනකයෙන් පිටවන ගෑස් එම රෝහලේ ඖෂධ අංශය විසින් යොදා ගනී.

### 6.4.3 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ජීවවායු ජනක සඳහා උපදේශක සේවා ලබාදීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ආයතනයේ අවන්හලේ මුළුතැන්ගෙයි ආහාර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ජීවවායු ජනකයක් ඉදිකර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය ආයතනයට පවරා දෙන ලදී. ජීවවායු ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ 2$m^3$ ධාරිතාවයකින් යුත් ප්ලාස්ටි-ෂෙල් ජීව වායු ජනක යන්ත්‍ර 5ක්, වානේ

වලින් සාදන ලද පාවෙන ගෑස් ධාරක, ජීව වායුව මාර්ග සහ ජීව අපද්‍රව්‍ය එකතු කිරීමේ මාර්ග වේ. මුළුතැන්ගෙයි ආහාර කිලෝග්‍රෑම් 50 ක් දිනපතා ජනකය වෙත දමන අතර එම ජනකයෙන් නිකුත්වන වායුව යොදාගෙන මුළුතැන්ගෙයි ආහාර පිසීම සඳහා භාවිතා කරයි. ජීව පොහොර වගාවන් සඳහා භාවිතා කරණු ලබයි.

### 6.4.4 ආදාහනාගාර අළුත්වැඩියා කිරීම උඩුබද්දාව ප්‍රාදේශීය සභාව, හබරාදුව ප්‍රාදේශීය සභාව සහ අම්බලන්ගොඩ

උඩුබද්දාව ආදාහනාගාරය සඳහා අළුත්වැඩියා කිරීම වූයේ තිබෙන පිටාර වායු නලය සහ සුදු යකඩ රැඳවුම් කම්බි 3ක් මාරු කිරීමය. මුදල රු. 605,000.00 වේ.



උඩුබද්දාව ආදාහනාගාරය



හබරාදුව ආදාහනාගාරය



අම්බලංගොඩ ආදාහනාගාරය

හබරාදුව ආදාහනාගාරයේ ගිනි මැස්ස අළුත්වැඩියා කිරීම සඳහා මුදල රු. 840,000.00 කි.
අම්බලංගොඩ ආදාහනාගාරය සඳහා ගෑස් පද්ධතිය හා නල මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා රු. 1,756,000.00 කි.

### 6.4.5 දුම් මාළු ඒකකය, කුඩු යන්ත්‍ර සහ හයිඩ්‍රොලික් ජැක් මගින් ක්‍රියාකරණ යුෂ නිස්සාරක සෑදීම

ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් දුම් මාළු ඒකක 3 ක් නිෂ්පාදනය කර සැපයූ අතර එහි මුළු පිරිවැය රු 701,000.00 කි. දුම් මාළු ඒකකයට වියළන කුටියක් සහ දුම් උත්පාදකයක් ඇතුළත් වේ.



දුම් මාළු ඒකකය



කුඩු කිරීමේ යන්ත්‍රය



හයිඩොලික් ජැක් එකක් මගින් යුෂ නිස්සාරකය

කුඩු කිරීමේ යන්ත්‍ර 13 ක් සහ හයිඩොලික් ජැක් මගින් ක්‍රියාත්මක කරන ලද තෙල් නිස්සාරක යන්ත්‍ර 06 ක් සෞඛ්‍ය හා පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට රු. 1,295,800.00 ක පිරිවැයකට සපයන ලදී.

## 6.5 දැනටමත් සිදු කරන ක්‍රියාකාරකම් සඳහා උපදේශක සේවා සැපයීම්

| | විස්තර | වටිනාකම |
|---|---|---|
| 01 | වාද්දුව යෝජිත සායනික ගොඩනැගිල්ල සඳහා උපදේශක සේවා | 7,500,000.00 |
| 02 | පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා උපදේශක සේවා | 2,040,000.00 |
| 03 | ගල්කිස්ස - ජර්මානු කාර්මික විද්‍යාලය සඳහා උපදේශක සේවා | 330,000.00 |
| 04 | මහනුවර ලංවිම සඳහා අඩු වියදම් නිවසක් ඉදිකිරීම | 1,035,392.00 |
| 05 | පොලොන්නරුව දිස්ත්‍රික්කයේ යෝජිත සෞඛ්‍ය මධ්‍යස්ථාන සඳහා උපදේශක කටයුතු | 213,043.48 |
| 06 | තල් යුෂ නිස්සාරකය සහ පිනාටු වියලනය , ඩෙල්ෆ් | 1,525,000.00 |

### 6.5.1 වාද්දුව යෝජිත සායනික ගොඩනැගිල්ල සඳහා උපදේශක සේවා

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වාද්දුව වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උපදේශක සේවා සැපයීමයි. තෙමහල් ගොඩනැගිල්ලට බාහිර රෝගී අංශය, ප්‍රසව සායනය, අරුනෝදය ළමා සංවර්ධන ඒකකය, වෛද්‍ය නිලධාරී කාර්යාලය, දන්ත සායනය සහ ශ්‍රවණාගාරයක් ඇතුළත් වේ. මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 1440 කි. උපදේශක සේවයේ වටිනාකම ඉදිකිරීම් කොන්ත්‍රාත් මුදලින් 5% ක් වන අතර එය ආසන්න වශයෙන් රු. මිලියන 3.2 කි.

### 6.5.2 පරමාණුක බලශක්ති මණ්ඩලය සඳහා උපදේශක සේවා

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB) NCNDT සඳහා නිරාවරණ කාමරයක් ඉදිකිරීම සඳහා උපදේශක සේවා සැපයීම මෙම ව්‍යාපෘතියයි. තනි මහල් ගොඩනැගිල්ලට ගැමා වළ, පාලක සහ මෙහෙයුම් ඒකකය දළ වශයෙන් වර්ග මීටර113 වේ. උපදේශක සේවා වල වටිනාකම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ 6% ක් පමණ වන අතර එය ආසන්න වශයෙන් රු. මිලියන 1.64 වේ.

### 6.5.3 ගල්කිස්ස/රත්මලාන - ජර්මානු කාර්මික විද්‍යාලය සඳහා උපදේශක සේවා

## 6.6 2018 වර්ෂය සඳහා තාක්ෂණික අලෙවිකරණ දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්

තාක්ෂණික අලෙවිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ නර්ඩ මධ්‍යස්ථානය මගින් සංවර්ධනය කරන ලද සාර්ථක තාක්ෂණයන් ව්‍යාප්ත කිරීමයි.

### 6.6.1 ව්‍යවසායකයින් සඳහා තාක්ෂණ හුවමාරුව

| දියුණු කල තාක්ෂණයන් | නිකුත් කල තාක්ෂණ බලපත්‍ර |
|---|---|
| බොටම් ඇෂ් මිශ්‍ර සිමෙන්ති කුට්ටි සහ පදික බ්ලොක් | 12 |
| කුරුඳු තෙල් ආසවනය ඒකකය | 02 |
| ආදාහනාගාරය | 01 |
| අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය | 03 |
| එළවළු වියලනය | 01 |
| බේකරි අවන් | 01 |
| සූර්ය ජල තාපක තාක්ෂණය | 01 |
| බොටම් ඇෂ් තාක්ෂණය | 01 |
| පෙරසවි කොන්ක්‍රීට් පැති බැම්ම සඳහා පෙරසවි කොන්ක්‍රීට් පැනල් නිෂ්පාදනය කිරීම. | 01 |

**තාක්ෂණ පැවරුම් ආදායම - 119,000.00**

### 6.6.2 බලපත්‍ර අලුත් කිරීම

| තාක්ෂණය | බලපත්‍ර අලුත්කිරීම් ගණන |
|---|---|
| එළවළු වියලනය | 01 |
| ආදාහනාගාර ගොඩ නැගීම | 07 |
| අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය | 21 |
| පෙරසවි අංගන | 05 |
| කපු වියලනය | 01 |
| ජීව වායු තාක්ෂණය | 01 |

### 6.6.3 දැනුවත් කිරීමේ වැඩසටහන්

| දිනය | දැනුවත් කිරීමේ වැඩසටහන් | සහභාගී වූවන් සංඛ්‍යාව |
|---|---|---|
| 09.02.2018 | ඉලෙක්ට්‍රොනික කර්මාන්තය සඳහා | 19 |
| 23.03.2018 | කළුතර හි පැවති නර්ඩ තාක්ෂණ සහ අඩි පාලම් තාක්ෂණය පිළිබඳව | 100 |
| 26.03.2018 | නුවර හි පැවති නර්ඩ තාක්ෂණ සහ අඩි පාලම් තාක්ෂණය පිළිබඳව | 70 |
| 20.04.2018 | ත්‍රිකුණාමලයේ පැවති නර්ඩ තාක්ෂණ සහ අඩි පාලම් තාක්ෂණය පිළිබඳව | 30 |
| 22 - 25.05. 2018 | ත්‍රිකුණාමලයේ පැවති අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳව | 9 |
| 25.05.2018 | පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අඩි පාලම් තාක්ෂණය පිළිබඳව | 50 |
| 28.05. 2018 | කුරුණෑගල දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයේ නර්ඩ තාක්ෂණයන් පිළිබඳ | 150 |
| 14.06. 2018 | යක්කල සණස ගොඩනැගිල්ලේ නර්ඩ තාක්ෂණ පිළිබඳව | 50 |
| 25.06.2018 | ව්‍යවසායකයින් සඳහා කුරුඳු තෙල් ආසවනය කිරීමේ ඒකකය | 05 |
| 18-19.09. 2018 | අම්පාර ව්‍යාපාරික සායනය සඳහා නර්ඩ තාක්ෂණයන් පිළිබඳව | 40 |
| 20.09.2018 | පන්නල දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයේ නර්ඩ තාක්ෂණයන් පිළිබඳව | 45 |
| 18.12.2018 | යාන්ත්‍රික ස්ලිප් ෆෝම් බිත්ති ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳව | 45 |

### 6.6.4 පුහුණු වැඩසටහන්

| | පුහුණු වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | ආදායම (රු.) |
|---|---|---|---|
| 1 | සිමෙන්ති පස් ගල් නිෂ්පාදනය | 09 | 16,873.04 |
| 2 | යුරෝපා සංගම් අරමුදල් සපයන ප්‍රතිලාභීන් සඳහා පෙරසවි කොන්ක්‍රීට් උපාංග පිළිබඳ දෙදින පුහුණුව | 48 | 328,768.70 |
| 3 | අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණ පුහුණු වැඩසටහන. (දින 4) | 09 | 72,860.86 |
| 4 | සම්පීඩිත සිමෙන්ති පස් ගල් නිෂ්පාදනය (දින 01) | 15 | 31,956.52 |
| 5 | අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පුහුණු වැඩසටහන(දින 4) | 20 | 149,982.61 |
| 6 | බශ්ම මිශ්‍ර සිමෙන්ති ගල් සහ බිම් ඇතුරුම් කැට | 09 | - |
| 7 | අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පුහුණු වැඩසටහන(දින 4) | 20 | 149,982.61 |
| 8 | අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පුහුණු වැඩසටහන(දින 4) | 15 | 112,486.95 |

### 6.6.5 ප්‍රදර්ශන සඳහා සහභාගී වීම්

| දිනය | ප්‍රදර්ශනය |
|---|---|
| 11.05.2018 | මාතර සනයා හෝටලයේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සුළු තාක්ෂණ 2018 සඳහා සහභාගී විය. |
| 18-20.05 2018 | බණ්ඩාරනායක අනුස්මරන සම්මන්ත්‍රණශාලාවේ ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද බිල්ඩ් ශ්‍රී ලංකා 2018 |
| 22-24.06 2018 | බණ්ඩාරනායක අනුස්මරන සම්මන්ත්‍රණශාලාවේ පැවති Inco 2018 ප්‍රදර්ශනයකට සහභාගී විය |
| 10-12.08. 2018 | බණ්ඩාරනායක අනුස්මරන සම්මන්ත්‍රණශාලාවේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද COMEXPO 2018 ප්‍රදර්ශනයට සහභාගී විය. |
| 17.08. 2018 | කුරුණෑගල බිලූ ස්කයි ග්‍රෑන්ඩ් හෝටලයේ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද සුළු තාක්ෂණ 2018 ප්‍රදර්ශනයට සහභාගී විය. |
| 29– 31.08. 2018 | මොණරාගල පැවති මුදල් හා මාධ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද ව්‍යවසාය ශ්‍රී ලංකා 2018 ප්‍රදර්ශනය |
| 12-14.10. 2018 | බණ්ඩාරනායක අනුස්මරන සම්මන්ත්‍රණශාලාවේ පැවති 2018 තාක්ෂණ ප්‍රදර්ශනය |
| 16-17.11. 2018 | නර්ඩි මධ්‍යස්ථානයේ පැවති ඉංජිනේරු ප්‍රදර්ශනය - 2018. |

### 6.6.6 රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන්

| දිනය | වැඩසටහන |
|---|---|
| 7,14,21,28.01.2018 | සිරස නාලිකාවේ අඩු වියදම් නිවාස තාක්ෂණය පිළිබඳ "කැදැල්ල" වැඩසටහන් |
| 21.02.2018 | නර්ඩි අඩු වියදම් නිවාස තාක්ෂණය පිළිබඳව "සිත් පහන් වෙත" ගුවන් විදුලි සජීවී වැඩසටහන |
| 05.01.2018 | ITN රූපවාහිනී මල්පාර සජීවී වැඩසටහන. |
| 11–18.02.2018 | සිරස රූපවාහිනී නාලිකාවේ අඩු වියදම් නිවාස තාක්ෂණය පිළිබඳ "කැදැල්ල" වැඩසටහන |
| 27.02. 2018 | පාරිසරික ගැටළු සහ පුනර්ජනක බලශක්තිය පිළිබඳව සජීවී ගුවන් විදුලි වැඩසටහන |
| 16.03.2018 | කෘෂි යන්ත්‍ර ගැන සජීවී ගුවන් විදුලි වැඩසටහනක් |
| 05.07.2018 | ලක්විරු ගුවන් විදුලියේ සජීවී සාකච්ඡාව |
| 12-17.11.2018 | රූපවාහිනී දෙරණ පසුතලයේ දැක්වෙන නර්ඩි ඉංජිනේරු ප්‍රදර්ශනය 2018 |

### 6.6.7 පුවත්පත් ලිපි

| අංක | විස්තර |
|---|---|
| 1 | පුහුණු වැඩසටහන පිළිබඳ විස්තර මුහුණු පොතේ දැක්වීම. |
| 2 | පුහුණු වැඩසටහන පිළිබඳ විස්තර වෙබ් දැන්වීම මගින් |
| 3 | පුහුණු වැඩසටහන පිළිබඳ වෙබ් ලිපිය මගින් |
| 4 | පළමු කාර්තුවේ පුහුණු වැඩසටහන් පිළිබඳ කඩදාසි දැන්වීම් - 03 යි. |
| 5 | වෙබ් ලිපි - 02 යි. |
| 6 | කිරි දීමේ යන්ත්‍රයේ තාක්ෂණික හුවමාරුව පිළිබඳ වෙබ් දැන්වීම |
| 7 | "විදුලිය භාවිතා කරන්නේ කෙසේද" යන්න වෙබ් + මුහුණ් පොතේ දැන්වීම |
| 8 | අඩු වියදම් ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ (දින 4) වැඩ සටහන - වෙබ් දැන්වීම |
| 9 | වැඩමුළුවේ වෙබ් දැන්වීම - ශබ්දය සහ වායු විමෝචන ගුණාත්මක කළමනාකරණය |
| 10 | කැදැල්ල සඟරාව - සැප්තැම්බර් කලාපය - 01 යි. |
| 11 | අමාත්‍යාංශ මාධ්‍ය ඒකක වෙත ප්‍රවෘත්ති යාවත්කාලීන කිරීම් 12 යි. |
| 12 | වෙබ් ලිපි - 12 යි. |
| 13 | ප්‍රවෘත්ති දැන්වීම් - 03 යි. |
| 14 | වෙබ් ලිපි / ප්‍රවෘත්ති යාවත්කාලීන කිරීම් |

### 6.6.8 වර්ෂය තුළ පේටන්ට් බලපත්‍ර ලබාගැනීම්

| පේටන්ට් බලපත්‍ර අංකය | පේටන්ට් බලපත්‍ර | ගොනු කිරීමේ දිනය |
|---|---|---|
| 16068 | තල් ගස් යුෂ නිස්සාරකය සඳහා පේටන්ට් බලපත්‍රය ලබා ගැනීම | |
| 19847 | වාරිමාර්ග ඇළ මාර්ගවල එසවුම් දොරටු පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා පාවෙන යාන්ත්‍රණය සඳහාපේටන්ට් බලපත්‍ර අයදුම් කිරීම | 24.04.2018 |
| 20273 | ජංගම පාලක රොබෝ සහ රැහැන් රහිත සංවේදක ජාලය සමඟ ආරක්ෂක නිරීක්ෂණ සඳහා පද්ධතියක් සඳහා පේටන්ට් බලපත්‍රය අයදුම් කිරීම | 11.12.2018 |

## 6.7 තාක්ෂණික ඉන්කියුබේටරය විසින් සපයනු ලබන සේවාවන්

### 6.7.1 අරමුණු හා පහසුකම්

නිෂ්පාදන සම්පත් කර්මාන්තය සමඟ බෙදාගෙන සම්මත තත්ත්ව මට්ටම් සපුරාලීමට ඔවුන්ට සහාය වීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට උපකාර කිරීම සඳහා තාක්ෂණ ඉන්කියුබේටරය ස්ථාපිත කිරීමේ අරමුණ වේ. පහත සඳහන් පහසුකම් වලින් සමන්විත වේ.

- CAD / CAM ඒකාබද්ධ මෘදුකාංග (සොලිඩ් වර්කස් - 2014) - සීඑන්සී ලියවනපට්ටල් යන්ත්‍රය
- CNC EDM වයර් කපන යන්ත්‍රය - CNC EDM යන්ත්‍රය (ස්පාර්ක් බාදනය)
- මතුපිට පෘෂ්ඨය මැදීමේ යන්ත්‍රය - සම්බන්ධීකරණ මිනුම් යන්ත්‍රය
- ඇඹරුම් සහ කැටයම් පිටපත් කිරීමේ යන්ත්‍රය - අච්චු ඔප දැමීමේ උපකරණ
- උපකරණ පරීක්ෂා කිරීම සහ මැනීමේ යන්ත්‍රය - නිරවද්‍ය සිලින්ඩරාකාර ඇඹරුම් යන්තය
- ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රය - අධිවේගී ස්කෑනිං යන්ත්‍රය

### 6.7.2 2018 වර්ෂයේදී සිදු කරන ලද නිරවද්‍ය යන්ත්‍ර, ඉංජිනේරු සැලසුම් සහ පිරිසැකසුම් ක්ෂේත්‍ර සඳහා වන සේවා නව නිපැයුම්කරුවන්ට / කර්මාන්ත ආරම්භකයින්ට / ශිෂ්‍යයින්ට සේවා සැපයීම්

| අයිතම විස්තරය | සම්පූර්ණ කිරීම් % | ඇස්තමේන්තුගත පිරිවැය (රු.) |
|---|---|---|
| පොල් ගෑම සහ කිරි නිස්සාරකය | 60% | 9,000.00 |
| සූත්‍ර මෝටර් රථයේ අභිරුචි කරන ලද උපාංග නිරවද්‍ය යන්ත්‍රණය කිරීම | 100% | |
| “ඉනෝවා මයින්ඩ් 2018” තරඟය සඳහා තෝරාගත් මූලාකෘති විස්සක පාසල් සිසුන්ගේ අලෙවිකරණ මට්ටම. | | |
| යතුරුපැදි සඳහා වූ පැති ආරක්ෂිත පද්ධතිය | 100% | 5,000.00 |
| පරාග යන්ත්‍රයේ කොටස් ත්‍රිමාණ මුද්‍රණය කරන්න | 100% | 10,000.00 |
| ආරක්ෂිත බස් පාද පුවරුව සඳහා ත්‍රිමාණ පරිපථ පෙට්ටි මුද්‍රණය කරන්න | 100% | 7,000.00 |
| ගංවතුර ආවරණ අච්චුව වෙනස් කිරීම | 100% | 2,000.00 |
| ත්‍රිමාණ ජල තාපක හසුරුව ආවරණයක් මුද්‍රණය කිරීම | 100% | 5,000.00 |
| බුෂ් ට්‍රයිමර් ධාරිත්‍රය සඳහා මෝටර සවිකිරීමේ ආධාරකය | 100% | 5,000.00 |
| පළතුරු නෙලන කෙක්ක සෑදීම | 100% | 15,000.00 |
| දොර වැසීම නතර කර ගැනීමේ උපකරණය සෑදීම | 100% | 5,000.00 |
| රෝල්ස් සාදන යන්ත්‍රය | 100% | 30,000.00 |
| ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රය මගින් ඩස්ට් පෑන් සඳහා වැලි සහ අනෙක් ද්‍රව්‍ය වෙන් කරන ප්ලාස්ටික් දැලක් නිර්මාණය කිරීම. | 100% | 2,000.00 |

### 6.7.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ වෙනත් කර්මාන්ත සඳහා යන්ත්‍රෝපකරණ සේවා සැපයීම.

| සැපයූ සේවා | සේවාලාභියා | මුදල (රු.) |
|---|---|---|
| ඩයි ප්ලේට් එකේ මතුපිට ගෑම | LIAS Pvt Ltd Pilimathalawa | 22,500.00 |
| සන යකඩ ප්ලේට් 2 ක මතුපිට ගෑම | for Crystal pak | 101,000.00 |
| පිකර්ස් 11ක දෘඩතාවය පරීක්ෂා කිරීම | Warna Exporters Ltd, Padukka | 15,000.00 |
| යන්ත්‍ර කොටසක දෘඩතාවය පරීක්ෂා කිරීම | K.K Jagathsiri, Udugampola | 1,200.00 |
| ඔටෝ කැඩ් පුහුණුව | Bernard Perera / Sena Jayaweera | 25,500.00 |
| මසුන් ඇල්ලීම සඳහා බිලි කොක්කට ඊයම් බරුවක් සෑදීමේ අවිවූව | | 13,293.90 |
| ජීඅයි තහඩු 10ක ඝණකම පරීක්ෂා කිරීම | (Macbertan) | 10,000.00 |
| යන්ත්‍ර කොටස් 4 ක ඝනකම පරීක්ෂා කිරීම | (Ardmel (Pvt) Ltd) | 5,000.00 |
| අවිවූ තහඩුවක මතුපිට ගෑම | Sachentha Pvt Ltd | 5,000.00 |

### 6.8 බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්

බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව පහත සඳහන් කාණ්ඩ යටතේ ඉල්ලුම මත පදනම්ව කර්මාන්ත සඳහා සේවාවන් ලබා දී ඇත.

- පාරිසරික රසායනාගාර පරීක්ෂණ
- කර්මාන්ත සඳහා පාරිසරික ගැටළු පාලනය කිරීම සඳහා විසඳුම් ලබා දීම
- රෙගුලාසි වලට අනුව පාරිසරික අධීක්ෂණ සේවා සැපයීම
- බොයිලේරු ක්‍රියාකාරිත්වය සහ විමෝචක වායු විශ්ලේෂණය
- කාර්මික ක්‍රියාවලි අධීක්ෂණය සහ උපදේශක සේවා
- පුහුණු වැඩසටහන්
- බලශක්ති සම්බන්ධ සේවා පැවැත්වීම

අපේක්ෂිත දායක ඉලක්කය සහ උපයා ගත් මුදල් පිළිවෙලින් රු 8.01M සහ රු. 8.69 M වේ.

### 6.8.1 අනෙකුත් සේවා

| ක්‍රියාකාරකම් වර්ගය | සේවා ගණන |
|---|---|
| ස්ථිතික ප්‍රභව දහන පද්ධති, බොයිලේරු ක්‍රියාකාරිත්වය සහ විමෝචන අධීක්ෂණය | 168 |
| රෙගුලාසි වලට අනුව ශබ්ද මට්ටමේ මිනුම් | 130 |
| සම්මත නීති රෙගුලාසි වලට අනුව සංසරණ වායු නිර්ණය කිරීම | 72 |
| ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ කර්මාන්තවල පාරිසරික ගැටළු පාලනය කිරීම සඳහා විසඳුම් ලබා දීම | 29 |
| කාර්මික ක්‍රියාවලි අධීක්ෂණ සේවා | 53 |
| හොරන හි කෝට්ස් ත්‍රෙඩ්ස් (පුද්ගලික) හි බලශක්ති විගණනය | 1 |

### 6.8.2 රසායනාගාර සේවා

| ක්‍රියාකාරකම් වර්ගය | සේවා ගණන |
|---|---|
| අපජලය නියැදි විශ්ලේෂණය | 92 |
| විදුලි ලාම්පු පරීක්ෂා කිරීම | 83 |
| ශීතකරණ පරීක්ෂා කිරීම | 4 |
| ස්වයංක්‍රීය බැටරි පරීක්ෂණ | 5 |

### 6.8.3 වාණිජ ක්‍රියාකාරකම් ඉලක්ක සහ උපයා ගැනීම්

2018 දී භෞතික හා මූල්‍ය ඉලක්ක සහ වාණිජ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලභා කර ගැනීම පිළිබඳ සාරාංශය

| ව්‍යාපෘති / ක්‍රියාකාරකම් | භෞතික (සේවා ගණන) | | මූල්‍ය (රු මිලියනය) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | | | දායකත්වය | | |
| | ඉලක්කය | තත්‍ය | ඉලක්කය | තත්‍ය | ඉලක්ක සපුරාලීම් (%) | ඉලක්කය | තත්‍ය | ඉලක්ක සපුරාලීම් (%) |
| කර්මාන්ත සඳහා සේවා | 433 | 455 | 13.35 | 14.55 | 109 | 8.01 | 8.69 | 109 |
| කර්මාන්ත සඳහා රසායනාගාර පරීක්ෂණ | 278 | 173 | 2.49 | 1.92 | 77 | 1.24 | 0.39 | 32 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | 2 | 2 | 0.30 | 0.15 | 50 | 0.15 | 0.06 | 40 |
| මුළු ගණන | | | 16.14 | 16.62 | | 9.40 | 9.14 | |

### 6.8.4 පුහුණු වැඩසටහන් පැවැත්වීම

2018 දී බලශක්ති හා පාරිසරික ක්ෂේත්‍රවලට අදාළ කර්මාන්ත අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පවත්වන ලදී. පවත්වන ලද වැඩසටහන් පහත පරිදි වේ.

"ශබ්දය හා සංසරණ වායු තත්ත්ව කළමනාකරණය පිළිබඳ වැඩමුළුව"

මෙම වැඩසටහන දින දෙකක පැවති අතර ප්‍රධාන වශයෙන් වාතයේ මූලික පරාමිතීන්, ප්‍රමිතීන් පරීක්ෂණ ක්‍රම සහ උපකරණ,ශබ්ද මූලික කරුණු, ප්‍රමිති, පරීක්ෂණ ක්‍රම සහ උපකරණ, ශබ්ද පාලන ක්‍රම සහ වායු ගුණාත්මක පාලන ක්‍රම පිලිබඳව අවධානය යොමු කරන ලදි.

"ජීව ස්කන්ධ බොයිලේරු ක්‍රියාත්මක කිරීමට හා විමෝචනය පාලනය කිරීමට කාර්යක්ෂම මාර්ගය පිළිබඳ වැඩමුළුව"

මෙම වැඩසටහන බොයිලේරු ක්‍රියාත්මක කිරීමට කාර්යක්ෂම ක්‍රම සහ විමෝචන පාලනය සහ අධීක්ෂණය වැනි අංශ දෙකක් කෙරෙහි අවධානය යොමු කර ඇත.

### 6.8.5 ISO 17025 සහතිකය

2018 දී බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව විසින් ශීතකරණ පරීක්ෂණ රසායනාගාරයට සහ ලාම්පු පරීක්ෂණාගාරයට අයිඑස්ඕ 17025 ප්‍රතිතනය ලබා ගැනීමට සැලසුම් කර තිබුණි. ක්‍රියාකාරකම් සැලැස්මට අනුකූලව කාර්යයන් දෙකම සම්පූර්ණ කරන ලදී. ඉහත ඉස්මතු කරන ලද රසායනාගාර දෙකෙහි ISO 17025 ප්‍රතිතනය ක්‍රියාත්මක කිරීමට අමතරව, 2016 දී ලැබුණු "අපජල පරීක්ෂා කිරීම" සහ "ශබ්ද මට්ටම් මිනුම්" සඳහා ISO "17025 ප්‍රතිතනය" අඛණ්ඩව හා යාවත්කාලීන කිරීමට බලශක්ති හා පාරිසරික සේවා දෙපාර්තමේන්තුව සමත් විය.

# 07 සුභසාධන හා ආගමික කටයුතු

ආයතනික කාර්ය මණ්ඩලයේ අන්තර් පුද්ගල සබඳතා, සහයෝගීතාවය, කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම, ආයතනික පොදු කටයුතු සඳහා දක්වන කැපවීම යනාදිය වර්ධනය කරලීමේ අරමුණින් සේවක සුභසාධක හා ආගමික ක්‍රියාකාරකම් සඳහා ද ආයතනය විසින් විශේෂ අවධානයක් දී කටයුතු කරනු ලබේ. ඒ අනුව, 2018 වර්ෂයේදී මධ්‍යස්ථානයේ සේවක සුභසාධක සංගමය හා ආගමික සංගම් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් සාරාංශය පහත සඳහන් පරිදි වේ.

## 7.1 සුභසාධක සංගමය

2018 වර්ෂය තුලදී මධ්‍යස්ථානයේ සුභසාධක සංගමය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

- ආයතනයේ පුරෝගාමී සභාපතිවරයෙකු වූ විද්‍යාජෝති ඒ.එන්.එස් .කුලසිංහ මැතිතුමාගේ ජන්ම දිනය නිමිත්තකරගෙන වාර්ෂිකව පවත්වනු ලබන ලේ දන්දීමේ වැඩසටහන සංවිධානය කිරීම - 2018.11.23

- නර්ඩ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් ක්‍රීඩා උත්සවයක් සහ සුහද හමුවක් සංවිධානය කිරීම - 2018.12.20

## 7.2 ආගමික සංගම්

බෞද්ධ සංගමය හා කතෝලික සංගමය යන සංගම් දෙක මධ්‍යස්ථානය තුල ආගමික කටයුතු සම්බන්ධයෙන් ප්‍රමුඛව ක්‍රියාත්මක වේ. මධ්‍යස්ථානයේ සේවක මහත්ම මහත්මීන්ගේ අධ්‍යාත්මීය හා මානසික සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් මෙම සංගම් දෙකෙහි පුරෝගාමීත්වයෙන් සිදු කරනු ලැබේ. මධ්‍යස්ථානයේ සෑම සේවකයෙකුම ස්වේච්ඡාවෙන් මෙම සංගම් දෙකෙන් එකක සාමාජිකත්වය හිමිවීම විශේෂත්වයකි.

එම සංගම් 2018 වර්ෂය තුලදී පහත සඳහන් ආගමික හා සමාජ සත්කාර ක්‍රියාකාරකම්හි නිරතව ඇත.

### 7.2.1 බෞද්ධ සංගමය

- මධ්‍යස්ථානයේ නව වසරේ කටයුතු ඇරඹීම නිමිත්තෙන් 2018.01.01 දින සෙත් පිරිත් සජ්ඣායනයක් පැවැත්වීම
- පූජ්‍යපාද පොල්පිති මූකලානේ ප්‍රඥ්ඥාසිරි ස්වාමීන්වහන්සේ විසින් 2018.02.26 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- වෙසක් පොහොය නිමිත්තකරගෙන පූජ්‍ය රාජකීය පණ්ඩිත අලන්කුලමේ ප්‍රේමසිරි ස්වාමීන්වහන්සේ විසින් 2018.04.24 දින සුමධුර ධර්ම දේශනයක් පැවැත්වීම
- 2018.10.25 වන දින ජාඇල, වැලිගම්පිටිය ජයවර්ධන ළමා නිවාසයේ දරුවන් සඳහා දිවා ආහාරය හා පරිත්‍යාගයන් සිදුකිරීම.
- 2018.12.07 දින මධ්‍යස්ථාන පරිශ්‍රයේදී සර්ව රාත්‍රික පරිත්‍රාන ධර්ම දේශනයක් සහ දානමය පිංකමක් පැවැත්වීම.

### 7.2.2 කතෝලික සංගමය

- ආයතනයේ වාර්ෂිකව පවත්වනු ලබන නත්තල් දේව මෙහෙය 2018.12.19 දින මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවැත්වීම

# 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. මූල්‍ය වාර්තා පිළියෙල කරන පදනම

සමාලෝචිත වර්ෂය ලෙස සලකා ඇත්තේ 2018.01.01. සිට 2018.12.31 කාලපරිච්ඡේදයය.

### 1.2 අගය කරලීම හා ගිණුම්ගත කරන පදනම

මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම හා ඓතිහාසික පිරිවැය සංකල්ප මත පදනම්වය.

### 1.3 ගණුදෙණු ක්‍රියාත්මක වූ හා ඉදිරිපත් කරන මූල්‍ය ඒකකය

මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පිළිබිඹු වන ගණුදෙණු සිදු කර ඇත්තේ හා ඉදිරිපත් කර ඇත්තේ මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයෙහි භාවිතා වන මූල්‍ය ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. එසේ නොවන අවස්ථාවකදී ඒ පිළිබඳ වෙනම දක්වා ඇත.

### 1.4 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ 2018.12.31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදයටය. මෙහිදී මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ගිණුම්කරණ සටහන් ප්‍රවර්ථන කාලපරිච්ඡේදය හා සැසඳිය හැකි වනු ඇත.

### 1.5 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චය කරලීම, ඇස්තමේන්තු හා උපකල්පනයන්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුව මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති, වත්කම්, වගකීම්, ආදායම්, අසම්භව්‍ය වගකීම් හඳුනාගැනීම් සම්බන්ධයෙන් කළමණාකරණ විනිශ්චය කරලීම් ඇස්තමේන්තුගත කරලීම හා උපකල්පනයන් භාවිතා කර ඇත. කෙසේ නමුත් උපකල්පනයන් හා ඇස්තමේන්තු සම්බන්ධයෙන් වන අවිනිශ්චිතතාවයන් මත ඉදිරිපත් කරන ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක ගැලපීම් ඉදිරි කාලපරිච්ඡේදයක සිදු විය හැක. මෙහිදී මධ්‍යස්ථානයේ ඉදිරි අනාගත අඛණ්ඩ පැවැත්ම හා සම්පත් ප්‍රමාණාත්මකභාවය පිළිබඳව කළමණාකාරිත්වය නිසි ඇගයීමක පිහිටා ඇත. තවදුරටත් මධ්‍යස්ථානයේ පැවැත්ම පිළිබඳව බලපාන අවින්ශ්චිත තත්වයක් හෝ සැකයක් කළමණාකාරිත්වය වෙත නොමැත. මෙනිසා මූල්‍ය ප්‍රකාශ සාදා ඇත්තේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මතය.

## 2. දේපල හා පිරියත

### 2.1 හඳුනාගැනීම හා මැනීම

පිරියත ලෙස ගෙන ඇත්තේ සෘජුව මිළදී ගැනීම් සඳහා අදාල වන වියදම්ය. මධ්‍යස්ථානය විසින්ම ගොඩ නංවා ගනු ලැබූ වත්කම්වල පිරිවැය ලෙස ඒවායේ අභිලාෂගත අරමුණු ඉටුවන මට්ටම දක්වා දරණ ලද අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සෘජුව හඳුනාගත හැකි වියදම් පිරිවැය ලෙස සලකනු ඇත. ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණ ගොඩනැංවීම් වලදී ගොඩනැගිලි ඉවත්කරලීම් පිරිවැය හා අදාල පරිදි ණය පොලී පිරිවැය ප්‍රාග්ධනිත කරනු ඇත. යම් ප්‍රාග්ධන භාණ්ඩයක අත්‍යාවශ්‍ය අංගයක් ලෙස මෘදුකාංග පවතින විට එම මෘදුකාංග පිරිවැය අදාල භෞතික උපකරණය සමඟම ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධන භාණ්ඩවල අනුයුක්ත කොටස් සඳහා වෙන වෙනම වූ ඵලදායී ජීවිත කාලයක් ඇති අවස්ථාවකදී එම භාණ්ඩයන් වෙන වෙනම හඳුනා ගැනේ. ස්ථාවර වත්කම් බැහැර කරලීමේ දී ජනිත වන ලාභ හෝ අලාභ හඳුනා ගැනෙන්නේ එම වත්කමේ විකුණුම් මිළ හා පොත්වල ඇති ශුද්ධ අගය සැසඳීමෙනි. මෙම උපලබ්ධි ලාභය/අලාභය අමතර ආදායම් හෝ අමතර වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හරලන අවස්ථාව වන විටදී ඒ හා අදාල අගයක් ප්‍රත්‍යාගණන සංචිතය තුල පවතින්නේ නම් එය ඉදිරියට ගෙනා රදවාගත් ඉපැයුම් ශේෂය සමඟ ගැලපේ.

## 2.2 ප්‍රත්‍යාගණනය

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීම සඳහා දේපල හා පිරියත සමගාමීව ප්‍රත්‍යාගණනය කරනුයේ එකම කාණ්ඩයට අයත් වත්කම් තෝරාගෙන වටිනාකම හා දින අතර ඇති වෙනස ඉවත් කිරීමටය.

වත්කම් කාණ්ඩවල ප්‍රත්‍යාගණනය පෙරෙලෙන පදනමක් යටතේ ප්‍රත්‍යාගණනය කරනුයේ වත්කම් කාණ්ඩ වල අගය සුලු කාලයක් ඇතුලතදී යාවත්කාලීන කිරීමටය.

දේපල හා පිරියත වල සාධාරණ අගය සාමාන්‍යයන් නිර්ණය කරන්නේ වෙළඳ අගය පදනම් කරගෙනය. වත්කම් වල ඇගයීම සිදු කරනු ලබන්නේ අගයන් පිළිබඳ වෘත්තීමය දැනුමක් ඇති කණ්ඩායමක් විසිනි. වත්කම් වැඩි ප්‍රමාණයක සාධාරණ අගය ගනු ලබන්නේ වෙළඳපොලේ සඳහන් මිල අනුවය.

ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩ වල අගයෙහි වැඩිවීමක් ලැබූ විට එය ප්‍රත්‍යාගණන අතිරික්තයක් ලෙස පෙන්වයි. කෙසේ වෙතත් ඌනතාවයක් පෙන්නුම් කරන අවස්ථාවේදී අතිරික්තය සමතුලිත වන සේ ඌනතාවය කපා හැරේ. ප්‍රත්‍යාගණන අතිරික්තය එකම කාණ්ඩයක් යටතේ ඇති වත්කම් වලින් කපා හැරීම මිස වෙනත් කාණ්ඩයක ඇති අතිරික්ත වලින් කපා හැරීම සිදු නොකෙරේ.

## 2.3 ක්ෂය කරලීම

වත්කම් ක්ෂය කරලීම වත්කම් වල පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කරලීමෙන් අනතුරුව එන අගය මත පදනම් වනු ඇත. යම් වත්කමක් සංයුතියෙහි ඇති ප්‍රමාණාත්මක වැදගත් අංශයන්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය විවිධ වන අවස්ථාවලදී ඒවා වෙන වෙනම ක්ෂය කරලීමට භාජනය කරනු ඇත. වත්කම් වල ක්ෂය ඒවායේ ඇස්තමේන්තුගත ජීවිත කාලය තුල ලාභාලාභ ගිණුමෙහි පෙන්වනු ඇත. සලකා බලන වර්ෂයේදී හා පසුගිය වර්ෂයේදී මෙම ඇස්තමේන්තුගත අනුපාතයන් පහත පරිදිය.

| වත්කම් කාණ්ඩය | ක්ෂය% |
|---|---|
| ගොඩනැගිලි | 2.5 |
| කාර්යාල උපකරණ | 15 |
| උපකරණ | 15 |
| ප්‍රදර්ශන භාණ්ඩ | 15 |
| පරිසණක යන්ත්‍ර | 331/3 |
| රථ වාහන | 15 |
| ලී බඩු උපකරණ | 10 |
| යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර පහසුකම් | 15 |
| පුස්තකාල පොත් | 05 |
| යටිතල පහසුකම් | 15 |
| මෘදුකාංග | 33 1/3 |

## 2.4 පොත්වලින් ඉවත්කරලීම

වත්කමක ගෙන යන අගය පොත්වලින් ඉවත්කරලීම එහි අනාගත ඇස්තමේන්තුගත ප්‍රතිලාභ නොමැති විටදී හෝ එය ඉවත් කරනු ලබන විටකදී සිදු කරනු ඇත. වත්කම් බැහැර කරන අවස්ථාවකදී සිදුවන ලාභ හා පාඩු, වත්කම් වල විකුණුම් අගය හා ශුද්ධ අගය අතර වෙනස සැසඳීමෙන් ගන්නා අතර එය මෙහෙයුම් වාර්තාවන්හි අනෙකුත් ආදායම් යටතේ දක්වනු ඇත.

### 2.5 අස්පෘශ්‍ය වත්කම්

මධ්‍යස්ථානය විසින් අත්පත් කරගන්නා ලද නිශ්චිත ජීවන කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් අගය කරනු ලබන්නේ පිරිවැයෙන් ඒවායේ ක්‍රම ක්ෂය හා මුලු අගය අඩුවීම්ද ගැලපීමෙනි. අනතුරුව ලැබෙන වියදම් ප්‍රාග්ධනිත කරනු ලබන්නේ එම වියදම නිසා අදාල අස්පෘශ්‍ය වත්කමෙහි අනාගත ප්‍රතිලාභ ලැබීම වර්ධනය වන ස්වරූපයක් ඇති නම් පමණි. ක්‍රම ක්ෂය කරනු ලබන්නේ පිරිවැය හා අවශේෂ අගය අතර වෙනසටය. ක්‍රම ක්ෂය අගය මෙහෙයුම් ප්‍රකාශයන්හි සරල මාර්ග ක්ෂය ක්‍රමයට අදාල අනුපාතය මත පෙන්නුම් කෙරේ. භායනය කරනු ලබන්නේ අස්පෘෂ්‍ය වත්කම මධ්‍යස්ථානයේ භාවිතයට ගත් දින සිටය. අස්පෘෂ්‍ය වත්කමෙහි ඇස්තමේන්තුගත අනුපාතයන් සමාලෝචිත වර්ෂයන් හා සංසන්දනාත්මකව පහත දී ඇත.

- මෘදුකාංග - 33 1/3 %

භායන වර්ෂයන් ඵලදායී ජීවිත කාලය හා අන්ත අගය සෑම කාලපරිච්ඡේදකදීම සමාලෝචනය කරනු ඇත.

### 3. තොග

තොග අගය කර ඇත්තේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අවමය සලකාය. තොග පිරිවැය FIFO තොග නිකුත් කරලීමේ මූලධර්ම මත පදනම්ව ඇත. තොගයන් වර්තමාන ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරනු ලැබූ වියදම් ඒවායේ පිරිවැය ලෙස ඇත.

රසායනාගාර තොග හා කෙරීගෙන යන වැඩ ඒවායේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු අගයට ගෙන ඇත.

### 4. ලැබිය යුතු වෙළඳ ශේෂ

වෙළඳ ශේෂ ප්‍රථමයෙන්ම සාධාරණ අගය මත පදනම්ව හඳුනා ගැනේ. අනතුරුව ඵලදායී පොලී අනුපාතය මත අගය හීනවීම වට්ටම් කරලීම හා අගය පිරිහීම මත වෙන් කරලීමක්ද කරනු ලැබේ.

### 5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනා ගනු ලබන්නේ අතැති මුදල්, බැංකු මුදල්, තාවකාලික කැඳවුම් තැන්පතු හා රාජ්‍ය ආයතනවල අතිරික්ත තැන්පතු ගිණුම්ය.

### 6. දෙන ලද ණය හා ලැබිය යුතු ගිණුම්

යම්කිසි ස්ථාවර හෝ නිශ්චිත ගෙවීම් සිදු කරන හා වෙළඳපොල තුල සංසරනය නොවන ණය දීම් මුලින්ම සාධාරණ අගය හා සෘජුව ස්ථාපනය කල හැකි වියදම් මත පදනම්ව හඳුනා ගැනෙනු ඇත.

### 7. මූල්‍ය වගකීම්

ව්‍යුත්පන්නයන් නොවන මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස හඳුනා ගැනේ. මෙම අනෙකුත් මූල්‍යමය වගකීම් ලෙස නියෝජනය වන්නේ වෙළඳ ගෙවිය යුතු ගිණුම් හා සම්බන්ධිත පාර්ශවයනට කල යුතු ගෙවීම්ය. මෙම වගකීම් ප්‍රථමයෙන්ම හඳුනාගනු ලබන්නේ සාධාරණ අගයට යම් සෘජුව හඳුනාගත හැකි පිරිවැය ගැලපීමෙනි. මූල්‍ය තත්ව ප්‍රකාශනයේදී මූල්‍ය වගකීම් හා මූල්‍ය වත්කම් එකිනෙකට හිලව් කර පෙන්වනු ලබන්නේ මධ්‍යස්ථානයට ඒ සඳහා නීතිමය අයිතියක් පවතින්නේ නම් පමණි.

### 8. සේවක ප්‍රතිලාභ වගකීම්

සේවය හැරයාමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ ව්‍යවස්ථාපිතව දක්වා ඇති පරිදි සිදු කර ඇත. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා මධ්‍යස්ථානයේ දායකත්වය පිළිවෙලින් 15% හා 3% ක් වේ. 1983 අංක 12 දරණ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කර ඇත. පාරිතෝෂික වෙන්කරලීම සඳහා මහා භාණ්ඩාගාරය මගින් ප්‍රතිපාදන සපයනු ලැබේ. මෙම පාරිතෝෂික වෙන්කරලීම පහත පරිදි ගනනය කෙරේ. (අවසන් වරට ගත් මූලික වැටුප + ජීවන වියදම් දිමනාව සහ අනෙකුත් අදාල දීමනා /2 x සම්පූර්ණ කර ඇති වර්ෂ ගණන)

## 9. වෙන්කරලීම්

මින් නියෝජනය වන්නේ අතීතයේදී ඇතිවුනු සිද්ධියක් මත මධ්‍යස්ථානය වෙත වර්තමානයේදී හඳුනාගත හැකි නීතිමය හෝ ඵලදායි ස්වරූපයේ බැඳීම් මත විශ්වාසනීයව පූර්වකථනය කරගත හැකි අනාගත මූල්‍ය පිටතට ගලා යාමය.

## 10. වෙන්කරලීම්, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම්

ශේෂපත්‍ර දිනට මධ්‍යස්ථානය වෙත ඇති ප්‍රමාණය ඇස්තමේන්තු කර ගත හැකි, අනාගත සම්පත් පිටව යාමක් විය හැකි බැදියාවන් සඳහා වෙන් කරලීම් තබනු ඇත. අසම්භාව්‍ය වගකීම් සඳහා ශේෂ පත්‍රයේ සටහන් ලෙස දක්වා ඇත.

## 11. ආදායම් හඳුනා ගැනීම

යම්කිසි ආදායමක් විශ්වාසවන්තව ගණනය කලහැකි නම් හා ඊට අදාල ආර්ථික ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය වෙත හැකියාවක් ඇති අවස්ථාවේදී ආදායම් හඳුනා ගැනේ. ලැබී ඇති හා ලැබීමට ඇති අගයන්ගේ සාධාරණ අගයට වට්ටම් හා බදු ඉවත් කරලීමෙන් ආදායම් හඳුනා ගනී. ආදායම් හඳුනා ගැනීමේදී පහත දැක්වෙන විශේෂ ලක්ෂණයන් පදනම් කරගෙන ඇත.

### a) සංවර්ධිත තාක්ෂණයන් විකිණීම

අදාල තාක්ෂණයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකව ප්‍රතිලාභයේ හා අවදානමේ හිමිකාරිත්වයේ අයිතිය මාරු වීම සිදුවන අවස්ථාවේදී ආදායම හඳුනා ගනී. පවරනු ලැබූ තාක්ෂණයන් සම්බන්ධයෙන් පසු කාලින කළමණාකාරිත්ව හෝ පාලන මැදිහත් වීමක් මධ්‍යස්ථානය දරණු නොලැබේ.

### b) සේවා සැපයීම

සේවා ආදායම හඳුනාගනු ලබනුයේ අදාළ සේවාව ජනනය වූ හෝ කරනු ලැබූ කාල පරිච්ඡේදයටය.

### c) කොන්ත්‍රාත් ආදායම

කොන්ත්‍රාත්තුවක ආදායම එහි සමස්ථ ප්‍රතිඵලය විශ්වාසනීයව අගය කල නොහැකි විටකදී කර ඇති වැඩ ප්‍රතිශතය මත ලබා ගනී.

### d) බදු

ව්‍යවස්ථාපිතව මධ්‍යස්ථානය ගෙවිය යුතු වන ආදායම් බදු එකතු කල අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු යනාදිය අදාල ව්‍යවස්ථාපිත ආයතනයන්ට ගෙවනු ලැබේ.

### e) පොලී ආදායම

උපචිත වන අවස්ථාවේදී පොළී ආදායම හඳුනා ගනී.

### f) ජංගම වත්කම් බැහැර කරලීමෙන් ජනිත වන ලාභ හා අලාභ

ජංගම නොවන වත්කම් වල විකුණුම් මිලෙන් එම වත්කම් වල ශුද්ධ පොත් අගය හා ඒවා බැහැර කරලීමට කරනු ලබන අනෙකුත් වියදම් ද අඩු කරලීමෙන් පසු ලැබෙන ප්‍රතිඵලය ආදායම ප්‍රකාශනයට ගනු ලැබේ. තවද ප්‍රමාණාත්මක වශයෙන් අඩු අගයකින් සමන්විත ජංගම නොවන වත්කම් වල ඉවත් කරලීම එකිනෙකට වෙන වෙනම නොව පොදුවේ ශුද්ධ අගය දක්වනු ලැබේ.

### g) අනෙකුත් ආදායම්

අමතර ආදායම් ලෙස තාක්ෂණික පැවරුම් කටයුතු වල ශුද්ධ ලාභය, කැඳවුම් තැන්පතු හා බැදුම්කර පොලී ආදායම කාල ප්‍රමාද දඩ මුදල්, ලබා දී ඇති ණය වලට පොලී, නැවත නොගෙවන තැන්පතු, සැපයුම්කරුවන් ලියාපදිංචි කරලීම, සුළු ආදායම්, හානි වූ තොග විකුණුම්, ජංගම නොවන වත්කම් බැහැර කරලීම් ආදායම හා පොදු කාර්ය අයකර ගැනීම ආදිය ඇතුලත් වේ.

### h) විලම්භිත ආදායම

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් අත්පත් කර ගන්නා ජංගම නොවන වත්කම් වලට අදාල ක්ෂය වෙන් කරලීම් වලින් විලම්භිත ආදායම සමන්විත වේ.

## 12. ප්‍රදානයන්

ප්‍රදානයන් ලෙස ආදායම් ප්‍රකාශන වල දක්වනු ලබන්නේ ලැබීම සඳහා සාධාරණ සහතික වීමක් ඇති හා ලබා ගැනීම උදෙසා මධ්‍යස්ථානය විසින් සියළුම කොන්දේසි සපුරා ඇති විටකදිය. ප්‍රදානයන් ලැබීමේදි එය අදාල කාල පරිච්ඡේදයේදි ආදායමක් ලෙස සලකා එමගින් ආවරණය වන වියදම් සමඟ ගලපා ඇත. යම්කිසි ස්ථාවර වත්කමක් ලබා ගැනීම සඳහා අදාල වන පරිදි ලැබී ඇති ප්‍රදානයන් මත විලම්භීත ආදායම් ගණනය කෙරේ. මධ්‍යස්ථානයට මූල්‍ය නොවන ප්‍රදානයන් ලැබීමේදී සාධාරණ අගය මත ගණනය කරනු ලැබේ.

## 13. වියදම්, ආදායම් ප්‍රකාශනයන්හි ඉදිරිපත් කරලීම

ආදායම් ප්‍රකාශන වලදි ආදායමට අදාලව ජනනය වී ඇති වියදම සමඟ ගලපා ඇත. මධ්‍යස්ථානයේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යාමේ වියදම්, ජංගම නොවන වත්කම් වලට සම්බන්ධ ක්ෂය වැනි ආදායමට එරෙහිව ගොඩනැගෙන්නා වූ වියදම සලකනු ඇත.

## 14. පර්යේෂණ හා සංවර්ධන වියදම

පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ප්‍රමුඛතම මූල්‍යකරණය භාණ්ඩාගාරය මගින් ඉටු කෙරේ. පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් යම් සේවාදායකයෙකු විසින් මූල්‍යකරණය තරනු ලබන විට එහි පිරිවැයට එරෙහිව ආදායමක් ලෙස සටහන් කරනු ඇත. පිරිවැය ලෙස සෘජු පිරිවැය පමණක් සලකනු ඇත.

# 09 2018.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

2018.12.31 දිනට තත්ත්ව ප්‍රකාශය (අගය - රුපියල්)

| විස්තරය | 2018 | 2017 යලි සැකසූ |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 140,354,049.19 | 136,516,464.38 |
| වෙළඳ ණය ගැතියෝ | 18,517,051.79 | 2,365,845.75 |
| තොග | 10,843,891.09 | 9,254,216.45 |
| කලින් ගෙවීම් | 737,229.51 | 815,851.44 |
| වෙනත් ජංගම වත්කම් | 45,101,583.44 | 74,938,853.44 |
| | 215,553,805.02 | 223,891,231.46 |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල හා පිරියත | 553,816,062.45 | 544,199,245.80 |
| අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් | 368,195.45 | 345,770.45 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 26,096,072.67 | 26,771,564.62 |
| | 580,280,330.57 | 571,316,580.87 |
| **මුළු වත්කම්** | 795,834,135.59 | 795,207,812.33 |
| **බැරකම්** | | |
| **ජංගම බැරකම්** | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවියයුතු දෑ | 46,845,177.06 | 38,372,182.91 |
| මුළු ජංගම බැරකම් | 46,845,177.06 | 38,372,182.91 |
| **ජංගම නොවන බැරකම්** | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 103,094,433.50 | 101,529,300.36 |
| සුරක්ෂිත තැන්පතු | 6,200.00 | 6,200.00 |
| | 103,100,633.50 | 101,535,500.36 |
| මුළු බැරකම් | 149,945,810.56 | 139,907,683.27 |
| ශුද්ධ වත්කම් | 645,888,325.03 | 655,300,129.06 |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | |
| විලම්භීත ආදායම් | 140,353,874.58 | 125,705,996.60 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන් | 211,475,012.24 | 246,853,427.74 |
| ප්‍රත්‍යාගනන සංචිතය | 530,627,685.82 | 530,627,685.82 |
| සමුච්චිත අතිරික්තය/(ඌනතාවය) | (236,568,247.61) | (247,886,981.10) |
| ශුද්ධ වත්කම්/ස්කන්ධය | 645,888,325.03 | 655,300,129.06 |

ඉංජි.සී එම් දෙල්පවිත්‍ර
සභාපති

ඉංජි. ඩී ඩී ඒ නාමල්
අධ්‍යක්ෂ ජනරාල්

ඩී වී එස් පෙරේරා
අධ්‍යක්ෂිකා මුදල්

## 10 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් වර්ගීකරණය කායී පදනම මත විදහා පෑම

(මූල්‍ය ඒකකය - රුපියල්)

| විස්තරය | 2018 | 2017 යලි සැකසූ |
|---|---|---|
| අයභාරය | | |
| අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් හුවමාරු | 277,620,000.00 | 259,040,000.00 |
| විලම්භිත ආදායම් | 64,155,104.67 | 57,860,922.57 |
| අනෙකුත් අයභාරය | 49,308,858.65 | 23,862,106,58 |
| මුළු අයභාරය | 391,083,963.32 | 340,763,029.15 |
| වියදම් | | |
| පරිපාලන පිරිවැය | 276,012,522.51 | 256,159,093.30 |
| අනෙකුත් වියදම් | 33,816,159.28 | 27,098,777.07 |
| ක්ෂය | 69,844,589.35 | 63,535,779.30 |
| මූල්‍ය වියදම | 91,958.69 | 46,846.93 |
| මුළු වියදම | 379,765,229.83 | 346,840,496.60 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | 11,318,733.49 | (6,077,467.45) |

# 11 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(මූල්‍ය ඒකකය - රුපියල්)

| විග්‍රහය | 2018 | 2017 යලි සැකසූ |
|---|---|---|
| මෙහෙයුම් මත ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| සාමන්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ අතිරික්තය/ඌනතාවය | 11,318,733.49 | (6,077,467.45) |
| **මුදල් නොවන වෙනස්වීම්** | | |
| ක්ෂයවීම් | 69,844,589.35 | 63,535,779.30 |
| අඩමාන ණය සඳහා වෙන් කිරීම්වල වැඩිවීම | - | (113,107.71) |
| විලම්භිත ආදායම් (වැඩිවීම්/ අඩුවීම්) | (64,155,104.67) | (57,860,922.57) |
| ගෙවිය යුතු වියදම් වල වැඩිවීම්/ අඩුවීම් | 12,704,255.15 | 8,197,681.82 |
| සේවක පිරිවැය (වැඩිවීම්/ අඩුවීම්) | (2,666,127.86) | 619,167.86 |
| දේපල හා යන්ත්‍රෝපකරණ විකුණුම් (ලාභ/පාඩු) | 1,321,844.68 | 1,144,351.41 |
| අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම්/ අඩුවීම්) | 29,001,709.24 | (35,705,482.61) |
| ලැබීම්වල (වැඩිවීම්/ අඩුවීම්) | (16,151,206.04) | 23,435,869.86 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | 41,218,693.34 | (2,824,130.09) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිළට ගැනීම් | (80,818,492.37) | (30,795,703.46)) |
| පිරියත හා උපකරණ විකුණුම් | 12,816.69 | 1,084,163.36 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (80,805,675.68) | (29,711,540.10) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 34,900,000.00 | 37,997,000.00 |
| ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල් | 8,524,567.15 | 35,570,540.88 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | 43,424,567.15 | 73,567,540.88 |
| මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්) | 3,837,584.81 | 41,031,870.69 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 136,516,464.38 | 95,484,593.69 |
| කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 140,354,049.19 | 136,516,464.38 |

# 12 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**

**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

**2018.12.31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම්/ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය** **මූල්‍ය ඒකකය (රු.)**

| | ආරම්භක ප්‍රාග්ධනය | යලි සැකසූ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන | යලි සැකසූ විලම්භීත ආදායම් | අනෙකුත් මාර්ග වලින් ලද ප්‍රාග්ධනය | යලි සැකසූ ප්‍රත්‍යාගණන සංචිතය | යලි සැකසූ සමුච්චිත ලාභ/ අලාභය | මුළු ශුද්ධ ස්කන්ධය | 2017.12.31 දිනට යලි සැකසූ ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|
| 2017/01/01 දිනට ශේෂය | 1,000,000.00 | 45,252,317.70 | 162,046,853.46 | 148,553,634.87 | 530,695,685.82 | (241,809,513.65) | 645,738,978.20 | 672,681,789.66 |
| 2017 වර්ෂයේ වත්කම් ස්කන්ධයේ වෙනස්කම් | | | | | | | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදානයන්- භාණ්ඩාගාරයෙන් | | 37,997,000.00 | | | | | 37,997,000.00 | 31,114,964.00 |
| ලද ප්‍රාග්ධන ප්‍රදානයන් | | 35,570,540.88 | | | | | 35,570,540.88 | |
| විලම්භීත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන | | (21,520,065.71) | (36,340,856.86) | | | | (57,860,922.57) | (53,875,510.82) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | | | | | | (6,077,467.45) | (6,077,467.45) | (4,182,264.64) |
| ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය | | | | | (68,000.00) | | (68,000.00) | |
| 2017.12.31 දිනට ශේෂය | 1,000,000.00 | 97,299,792.87 | 125,705,996.60 | 148,553,634.87 | 530,627,685.82 | (247,886,981.10) | 655,300,129.06 | 645,738,978.20 |
| 2018 වර්ෂයේ ස්කන්ධයේ වෙනස්කම් | | | | | | | | |
| ලද ප්‍රාග්ධන ප්‍රදානයන් - භාණ්ඩාගාරයෙන් | | 34,900,000.00 | | | | | 34,900,000.00 | 37,997,000.00 |
| ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල් | | 8,524,567.15 | | | | | 8,524,567.15 | 35,570,540.88 |
| විලම්භීත ආදායමට මාරු කල ප්‍රාග්ධන ප්‍රදාන | | (78,802,982.65) | 14,647,877.98 | | | | (64,155,104.67) | (57,860,922.57) |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාවය) | | | | | | 11,318,733.49 | 11,318,733.49 | (6,077,467.45) |
| ප්‍රත්‍යාගනන සංචිත අතිරික්තය | | | | | - | | - | (68,000.00) |
| 2018.12.31 දින ඉදිරියට ගෙන ගිය ශේෂය | 1,000,000.00 | 61,921,377.37 | 140,353,874.58 | 148,553,634.87 | 530,627,685.82 | (236,568,247.61) | 645,888,325.03 | 655,300,129.06 |

# 13 2018.12.31 දිනට ගිණුම්කරන සටහන්

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**

**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

2018.12.31 දිනට ගිණුම්කරන සටහන්

1. පූර්ව වර්ෂ ගැලපීම (අගය - රුපියල්)

| අංකය යොමුව | විස්තරය | ගැලපුම් විස්තරය | | | 2017 | 2017.01.01 දිනට පෙර ශේෂය | මූල්‍ය තත්ත්වයට බලපෑම |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රකාශය | ගැලපීමෙන් පසු | | | |
| ශේෂය ඉ/ගෙ | | | | | (5,129,044.67 | (236,353,117.68) | |
| 1.01 | APH/COM/99/2017 Pinatu Dryer නිර්මාණය කරලීම හා බාරදීම යන ව්‍යාපෘතියට අයත් 2017 වසරේ ප්‍රවාහන පිරිවැයක් ගණුදෙනුකරු විසින් ලබා දීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 2,200,000.00<br>(1,890,741.49)<br>309,258.51 | 2,229,184.01<br>(1,890,741.49)<br>338,442.52 | 29,184.01 | | ණයගැති වැඩිවීම |
| 1.02 | වාහන නඩත්තු සඳහා වෙන් කරලීම් අඩුවීම(PD-8992) | | | | 11,750.00 | | උපචිත වියදම් අඩුවීම |
| 1.03 | RED/COM/146/14 දිඹුලාගල LPG ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධ වියදම් අධිවෙන්කරලීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 2,643,492.06<br>(2,580,581.47)<br>62,910.59 | 2,643,492.06<br>(2,369,770.06)<br>273,722.00 | | 210,811.41 | විකුණුමෙන් පසු සේවා වෙන්කරලීම අඩු කරලීම |
| 1.04 | RED/COM/147/14 ඇලහැර LPG ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධ වියදම් අධිවෙන්කරලීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 2,643,492.06<br>(2,412,595.09)<br>230,896.97 | 2,643,492.06<br>(2,338,785.09)<br>304,706.97 | | 73,810.00 | විකුණුමෙන් පසු සේවා වෙන්කරලීම අඩු කරලීම |
| 1.05 | APH/RES/74/16 සුළු හා මධ්‍යම පරිමාණ ක්ෂේත්‍රයන් හට දුම් ගැසූ මත්ස්‍ය ව්‍යාපෘතිය සඳහා පරීක්ෂා හා ප්‍රවාහන අධිවෙන්කරලීම් ගැලපීම | වියදම | 714,020.52 | 624,270.52 | 89,750.00 | | වගකීම් අඩුවීම |
| 1.06 | 2018-02 දරණ අධ්‍යක්ෂ තීරණ පත්‍රිකා අංක 141 අනුව නිලංකා වික්‍රමාරච්චි යන හිටපු සේවිකාවකටඅදාල පාරිතෝෂික හා දඩ මුදල් ලාභාලාබ ගිණුමට කපා හැරීම | | | | | 115,613.00 | ණයගැති වැඩිවීම |
| 1.07 | 2017 වර්ෂයට අදාල OBT පුහුණුව | | | | (494,000.00) | | උපචිත වියදම් වල වැඩිවීම |
| 1.08 | RED/COM/127/14 රන්ටැඹේ ජීව ජීරකය ඉදිකිරීමෙන් ලැබිය යුතුව තිබුණු රු.37,045.76 අංක 04-2018 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට හා අධ්‍යක්ෂ පත්‍රිකා 170 ට අනුව කපා හැරීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 37,045.76<br>(60,699.39)<br>(23,653.63) | <br>(60,699.39)<br>(60,699.39) | | (37,045.76) | ව්‍යාපෘතිවල එකතුකල අගය මත වටිනාකම් අඩුකරලීම |
| 1.09 | RED/COM/106/13 Flap gate Lifting ක්‍රමවේදය හා කොන්ක්‍රීට් නිවාස ආකෘතිය ආදායම අඩුවීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 227,000.00<br>(411,417.16)<br>(184,417.16) | 223,795.65<br>(411,417.16)<br>(187,621.51) | | (3,204.35) | ව්‍යාපෘතිවල එකතුකල අගය මත වටිනාකම් අඩුකරලීම |
| 1.10 | RED/COM/121/13 වග්ගල්මෝදර ඇල Flap gate ව්‍යාපෘතිවල එකතුකල අගය මත වන ආදායම අඩු කිරීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 364,000.00<br>(93,788.38)<br>270,211.62 | 362,612.60<br>(93,788.38)<br>268,824.22 | | (1,387.40) | ව්‍යාපෘතිවල එකතුකල අගය මත ආදායම අඩුකරලීම |
| 1.11 | RED/COM/95/15 කුරුණෑගල රෝහලෙහි දාහකාගාර විමිනි අළුත්වැඩියා ආදායම අඩුකිරීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 239,000.23<br>(175,270.00)<br>63,730.23 | 230,749.71<br>(175,270.00)<br>55,479.71 | | (8,250.52) | ව්‍යාපෘතිවල එකතුකල අගය මත ආදායම අඩුකරලීම |
| 1.12 | ආචාර්ය එන් සෝමරත්න වෙත ගෙවන ලද ගෞරවනීය ප්‍රදානයක් නැවත ආදායම් ගත කිරීම | | | | | 2000.00 | ශුද්ධ වත්කම්වල වැඩිවීම |
| 1.13 | දිරි දීමනා සඳහා අධිවෙන්කරලීම - පරිපාලන අඩුකරලීම් ගැලපීම | | | | | 349,409.78 | දිරිදීමනා වෙන් කරලීම අඩු කරලීම |
| 1.14 | N/MD/COM/04/118/2015 ව්‍යාපෘතිය අවසන් වන විට වෙන්කරලීමක් සිදු නොවූන ප්‍රවාහන ගාස්තු ගැලපීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 840,248.55<br>(764,942.37)<br>75,306.18 | 840,248.55<br>(784,942.37)<br>55,306.18 | | (20,000.00) | ණය හිමියෝ වැඩිවීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1.15 | ඉල්ලා නොසිටින ලද රඳවාගැනීම් මුදල ආදායම් ලෙස ගැනීම<br>ෂෙහාරා ඉලෙක්ට්‍රිකල්ස්- CVL/1.21B/13<br>දයා වන්දුසිරි - CVL/RES/102/12 | ආදායම | <br><br>33,986.05<br><br>15,938.45 | | | 49,924.50 | ගෙවිය යුතු රඳවා ගැනීම් අඩුවීම |
| 1.16 | වර්ෂ 05 ක් ගතවන තුරුත් හිමිකම් නොපාන ලද යලි ලබාදෙන තැන්පතු ආදායමට ගැනීම<br>ඩබ් ඒ කේ යූ පුෂ්පකුමාර<br>ස්මාර්ට් ජැනිටෝරියල්<br>එස් ජේ වයි කන්ස්ට්‍රක්සන්ස් | | <br><br>4.500.00<br>1.500.00<br>3.000.00 | | | 9000.00 | ඉදිරියට ගෙනෙන ලද අලාභ අඩුවීම |
| 1.17 | වැරදි සහගත ලෙස ගිණුම්ගත වුනු ප්‍රචාරන වියදම් නිවැරදි කරලීම.-ආචාර්ය කමල් කුරුනේරු- FUJI Innovations (Pvt)Ltd<br>නිෂ්කාශන වියදම් අඩුකර ලැබිය යුතු ලෙස අමාත්‍යාංශයේ උපදෙස් පරිදි සැලකීම | | | | 359,498.39 | | ලැබියයුතු අගයන්ගේ වැඩිවීම |
| 1.18 | RED/COM/136/14<br>රඳවාගැනීමේ මුදල් අධිවෙන්කරලීම | ආදායම<br><br>වියදම<br>ශුද්ධ | 1,241,000.15<br><br>(1,039,932.06)<br>201,068.09 | 1,225,804.60<br><br>(1,039,932.06)<br>185,872.54 | | (15,195.55) | රඳවාගැනීමේ මුදල් අඩුකරලීම |
| 1.19 | RED/COM/142/14<br>2016 වෂ්යේදී සැලකුවාවූ ආදායම 2018.11.23 දින අධ්‍යක්ෂ පත්‍රිකා 225 හා අධ්‍යක්ෂ රුස්වීම් 8-2018 තීරණය අනුව ලිහා හැරීම | ආදායම<br><br>වියදම<br><br>ශුද්ධ | 2,699,338.71<br><br>(3,933,810.84)<br><br>(1,234,472.13 | 2,069,096.06<br><br>(3,933,810.84)<br><br>(1,864,714.78) | | (630,242.65) | ණය ගැනියෝ අඩුකරලීම |
| 1.20 | පුස්තකාලයට මිලයට ගන්නා ලද සහරා - පුවත්පත් ප්‍රභේදය ලෙස සැලකීම | 2008<br>2009<br>2010<br>2011<br>2012<br>2013<br>2014<br>2015<br>2016<br>2017 | 634,068.74<br>616,924.42<br>135,844.42<br>558,698.33<br>315,678.00<br>520,441.22<br>80,892.45<br>319,201.67<br>211,995.00<br>205,351.99 | | (205,351.99) | (3,393,744.25) | ස්ථාවර වත්කම් අඩුකරලීම |
| 1.21 | N/MD/COM/04/118/2015<br>ව්‍යාපෘතියට අයත් දිරි දීමනා වෙන්කරලීම අඩු කරලීම | | | | 10,000.00 | | සමුච්චිත ක්ෂය වෙන්කරලීම අඩු කරලීම |
| 1.22 | සහරා සඳහා වෙන් කරන ලද සමුච්චිත ක්ෂය නැවත ගැලපීම | 2008<br>2009<br>2010<br>2011<br>2012<br>2013<br>2014<br>2015<br>2016<br>2017 | 289,368.60<br>267,765.30<br>50,144.22<br>171,903.53<br>78,962.74<br>112,013.02<br>12,144.95<br>33,334.73<br>10,628.79<br>1,761.00 | | 1,761.00 | 1,026,265.88 | සමුච්චිත ක්ෂය වල අඩු කරලීම |
| 1.23 | වර්ෂ 2006 ට පෙර එකතු කල අගය මත ලාභාලාභ ගිණුමට අයවන කොටස | | | | | (806,236.99) | ලැබිය යුතු අගයක් අඩු වීම |
| 1.24 | RED/COM/ACT/106/17 | ආදායම<br>වියදම<br>ශුද්ධ | 88,626.08<br>(82,620.69)<br>6,005.39 | 122,713.03<br>(82,620.69)<br>40,092.34 | 34,086.95 | | ආදායම් ඌන වෙන්කරලීම |
| 1.25 | 2017 බැහැරකරලීමට නිර්දේශිත වත්කම් ප්‍රතිසංස්කරණය කල හැකි බව සිවිල් අධ්‍යක්ෂිකාගේ දැන්වීම පරිදි නැවත පොත්පත්වලට ගැනීම<br>FA 0002893<br>FA0002941<br>FA0002928<br>යන්ත්‍රෝපකරන<br>FA0003739 | | <br><br>54,000.00<br>8,000.00<br>10,000.00<br><br>6,000.00 | <br><br>8,100.00<br>1,200.00<br>1,500.00<br><br>900.00 | <br><br>72,000.00<br>(10,800.00)<br>6,000.00<br><br>(900.00) | | ස්ථාවර වත්කම්වල වැඩිවීම |
| 1.26 | 2017 වර්ෂයේදී වත්කම් බැහැරකරලීම් ආදායම අඩුවෙන් සටහන් වීම | | | | 5992.93 | | ලැබියයුතු අගයන්ගේ වැඩිවීම |
| 1.27 | RED/COM/136/14<br>ව්‍යාපෘතියෙහි ආදායම් අඩුවීම මත බදු වෙන්කරලීම් අඩුවීම | | | | | 6,078.22 | ජංගම වගකීම් අඩුවීම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1.28 | RED/COM/95/15 ව්‍යාපෘතියෙහි ආදායම් අඩුකරලීම මත 2016 වර්ෂයෙහි දිරි දීමනා වෙන්කරලීම අඩු කරලීම | | | | | 3,300.20 | ජංගම වගකීම් අඩුවීම |
| 1.29 | RED/COM/110/2016 ආදායම්වල ඌන වෙන්කරලීම | ආදායම<br>වියදම<br>ශුද්ධ | 2,046,298.30<br>(1,468,337.95)<br>577,960.35 | 2,091,000.00<br>(1,468,337.95)<br>622,662.05 | 44,701.70 | | ණයගැති වැඩිවීම |
| 1.30 | පුස්තකාල පුස්තකයන් මත වන ක්ෂය වෙන්කරලීමේ අධි වෙන්කරලීම | | | | (83.59) | 443,632.27 | සමුච්චිත ක්ෂය ප්‍රමාණය අඩුකරලීම |
| 1.31 | අනෙකුත් ප්‍රභවයන්ගෙන් අත්පත් කරගත් යන්ත්‍ර හා පිරියත ක්ෂය ඌන වෙන් කරලීම<br>යන්ත්‍ර සූත්‍ර<br>උපකරණ | | | | <br><br><br>(1,042,050.00)<br>(36,997.50) | | ක්ෂය වෙන් කරලීම වැඩි කරලීම |
| 1.32 | Software ක්ෂය කරලීම අඩුවෙන් කරලීම | | | | 12,950.54 | | |
| 1.33 | විගණන ගාස්තු ඌන වෙන්කරලීම | 2015<br>2016<br>2017 | 191,475.00<br>191,475.00<br>191,475.00 | 198,375.00<br>358,800.00<br>358,800.00 | <br><br>(167,325.00) | (174,225.00) | ජංගම වගකීම් වැඩිවීම |
| 1.34 | 2013 වර්ෂයේදී විලම්බිත ආදායම අධි උකහා ගැනීම නිවැරදි කරලීම | | | | | (2,325,298.98) | ජංගම වගකීම් වැඩිවීම |
| | 2017 වර්ෂයේ ආදායම අඩුවෙන් සටහන් වීම | | | | (6,077,467.45) | (241,809,513.65) | |

උපකරණවල පිරිවැය ප්‍රවර්තන වර්ෂයේදී ගැලපීම = රුපියල් 55,754,346.69

**ප්‍රත්‍යාගනන අතිරික්තය ගැලපීම**

2006 වර්ෂයේදී ප්‍රාග්ධන භාණ්ඩ මත උකහා නොගත් එකතුකල අගය මත බදු ප්‍රත්‍යාගනන අතිරික්තය හා ගැලපීම

| | | |
|---|---|---|
| | | 530,627,685.82 |
| ගොඩනැගිලි | 912,778.49 | |
| ලීබඩු හා සවිකිරීම් | 138,817.24 | |
| කාර්යාල උපකරණ | 225,068.10 | |
| යන්ත්‍රෝපකරණ | 3,303,482.18 | (4,580,146.01) |
| | | 526,047,539.81 |

## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය
## 2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල

**2. සුරක්ෂිතයන් ලෙස තබන ලද ඇප තැන්පතු**

රුපියල්

| ඇපකරය නිකුත් කරන ලද්දේ | ඇප අංකය/දිනය | බැඳුම්කරය | සුරක්ෂිත ලෙස තබා ඇති සහතිකය | සුරක්ෂිතයෙහි වටිනාකම | බැංකුව | ඇප අගය |
|---|---|---|---|---|---|---|
| ටොයෝටා ලංකා පුද්ගලික සමාගම | 15/2008<br>19/12/2018 -18/12/2019 | ඇප තැන්පතු බැඳුම්කරය | C/33734579-507908 | 100,000.00 | | 75.000.00 |
| නාගරික කොමසාරිස් කුරුණෑගල | 10/2017<br>21/12/2017 - 21/12/2018 | ඇප තැන්පතු බැඳුම්කරය | 1057614-81889909<br>1057615-81889925<br>1057616-81889906 | 1,000,000.00<br>1,000,000.00<br>1,000,000.00 | | 2,845,000.00 |
| ජාතික උද්භිද උද්‍යානය | 3/2018<br>1/9/2018-26/1/2019 | කාර්ය සාධන බැඳුම්කරය | 1305449-83057498 | 1,000,000.00 | ලංකා බැංකුව ජාඇල | 127,413.25 |
| | 4/2018<br>28/8/2018-28/12/2018 | ඇප තැන්පතු බැඳුම්කරය | | | | 509,653.01 |
| පරමාණුක ශක්ති අධිකාරිය | 5/2018<br>6/9/2018-30/11/2018 | ඇප තැන්පතු බැඳුම්කරය | 1305490-83092247 | 1,000,000.00 | | 500,000.00 |
| ශ්‍රී ලංකා භින්ෂු විශ්වවිද්‍යාලය | 9/2018<br>4/12/2018-26/12/2019 | ඇප තැන්පතු බැඳුම්කරය | 1473755-83503832<br>1473756-83503837<br>1473757-83503700<br>1473758-83503765<br>1473759-83503726<br>1473760-83503712 | 1,000,000.00<br>1,000,000.00<br>1,000,000.00<br>1,000,000.00<br>1,000,000.00<br>1,000,000.00 | | 5,808,673.47 |
| | 7/2018<br>4/12/2018-26/12/2019 | කාර්ය සාධන බැඳුම්කරය | 1473754-83503820 | 1,000,000.00 | | 968,112.24 |

## 3. ස්ථාවර වත්කම් ඉවත්කරලීම

අගය (රු.)

| වත්කම් වර්ගය | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ අගය | විකුණුම් අගය | ලාභය/(අලාභය) |
|---|---|---|---|---|---|
| පරිගණක | 317,000.00 | 211,312.20 | 105,687.80 | 6,851.47 | (98,836.33) |
| ප්‍රදර්ශන භාණ්ඩ | 4,600.00 | 1,380.00 | 3,220.00 | 74.57 | (3,145.43) |
| ලීබඩු හා සවිකිරීම් | 34,128.53 | 6,825.71 | 27,302.82 | 2,229.80 | (25,073.02) |
| උපකරණ | 1,043,040.00 | 312,912.00 | 730,128.00 | 799.94 | (729,328.06) |
| කාර්යාල උපකරණ | 213,932.00 | 64,179.60 | 149,752.40 | 77.85 | (149,674.55) |
| පිරියත හා යන්ත්‍ර | 96,500.00 | 28,950.00 | 67,550.00 | 2,336.28 | (65,213.72) |
| මෘදුකාංග | 380,000.00 | 253,308.00 | 126,692.00 | - | (126,692.00) |
| ආයුධ | 177,089.08 | 52,760.73 | 124,328.35 | 446.79 | (123,881.57) |
| මුලු අගය | 2,266,289.61 | 931,628.24 | 1,334,661.37 | 12,816.69 | (1,321,844.68) |

## 4. පුස්තකාල පොත් ගැලපීම

පුස්තකාල පොත් ලෙස මිළදී ගෙන තිබුණු පුවත්පත් හා සඟරා, පුවත්පත් හා සඟරා ගිණුමට මාරුකිරීම

රුපියල්

| වර්ෂය | වටිනාකම | ක්ෂය වීම |
|---|---|---|
| 2008 | 634,068.74 | 289,368.59 |
| 2009 | 616,924.42 | 267,765.30 |
| 2010 | 135,844.42 | 50,144.22 |
| 2011 | 558,698.33 | 171,903.53 |
| 2012 | 315,678.00 | 78,962.74 |
| 2013 | 520,441.22 | 112,013.02 |
| 2014 | 80,892.45 | 12,144.95 |
| 2015 | 319,201.67 | 33,334.73 |
| 2016 | 211,995.00 | 10,628.79 |
| 2017 | 205,351.99 | 1,761.00 |
| | 3,599,096.24 | 1,028,026.88 |

## 5. වර්ෂය තුල මධ්‍යස්ථානයේ වාහන අනතුරු

| වාහන අංකය | අනතුර වූ දිනය | ඇස්තමේන්තු ගත මුදල | රක්ෂණ නියෝජිත | රක්ෂණය ඉල්ලුම් කල දිනය | ලද රක්ෂිත අගය | ලද දිනය | හිමිතම ලබන ලද්දේ |
|---|---|---|---|---|---|---|---|
| NB-1631 | 2018/02/14 | 21,600.00 | SLI | 2018/03/10 | 21,600.00 | 2018/08/08 | සොනාලි මෝටර්ස් |
| NB-1631 | 2018/09/18 | 166,000.00 | SLI | 2018/10/10 | 159,050.00 | Pending | NERDC |
| NB -1631 | 2018/09/28 | 15,000.00 | SLI | 2018/10/10 | 18,000.00 | Pending | NERDC |
| KX-7908 | 2018/10/31 | 38,900.00 | SLI | 2018/11/02 | 38,900.00 | 2018/11/10 | සොනාලි මෝටර්ස් |
| KR-5435 | 2018/07/18 | 9,950.00 | SLI | 2018/08/01 | 9,950.00 | 2018/08/20 | සොනාලි මෝටර්ස් |

අධ්‍යක්ෂක (මානව සම්පත්)

**06. තාවකාලික කැඳවුම් තැන්පතු**

මධ්‍යස්ථානයේ සේවකයන් විසින් එළෙඹෙන ලද බැදුම්කර, නිශ්චිත බැදුම්කර කාලය ඉක්මයාමට පෙර ආයතනයෙන් ඉවත්ව ඇති විටකදී අයකර ගන්නා ලද මුදල්ය. ඒවා ලංකා බැංකුවෙහි රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදලහි තැන්පත් කර ඇත. රු.8,994,089.90 ක අගයෙන් ලාභාංශ හා පොලී අගයෙන් එකතුවෙන් රු.1,500,000.00 ක මුදලක් 1/2017 මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතින් 2017/07/31 දිනැති චක්‍ර ලේඛණයට අනුව විශේෂ ණය මුදලක් ගෙවීම සඳහා රු.6,000,000.00 201811.15 දින ඉවත් කර ගන්නා ලද්දේ අනුමත පුනරාවර්තන මුදල් ලැබීම මතය. මෙහි 2018.12.31 වන විට වත්මන් අගය රු.6,151,535.11 ක් වේ.

ගණුදෙනුකරුවන්ගෙන් ලබන වැඩ අත්තිකාරම් අදාල වැඩ වලට උපයෝගී කර ගන්නා තෙක් කැඳවුම් තැන්පතු ලෙස බැංකුවේ තැන්පත් කරනු ඇත.ඉන් ලැබෙන පොලිය අමතර ආදායම් ලෙස දක්වා ඇත.

**07. කෙරීගෙන යන වැඩ**

2018 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ වල අගය අනෙකුත් ජංගම වත්කම් යටතේ පෙන්වා ඇතත් සලකා බලන වර්ෂයේදී එය තොග යටතේ පෙන්වා ඇත.

**08. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය**

2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාවන්හි පහත දැක්වෙන අනාවරනයන් කරනු ඇත. මෙම මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන කළමණාකාරිත්වය හා බැදුනු කිසිදු පාර්ශවයකට යම් ගෙවීමක් කර නොමැත.

**09. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ලබා දෙන ලද භාණ්ඩාගාරික මූල්‍යනයන් මගින් මිලයට ගත් වත්කම්**

| භාණ්ඩය | ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලැබීම | සැබෑ පිරිවැය |
|---|---|---|
| 3D coordinate measuring machine | 44,095,108.03 | 12,664,792.52 |
| CNC milling Machine | | 26,150,477.45 |
| Plastic 3D Printer Machine | | 5,279,838.06 |
| | 44,095,108.03 | 44,095,108.03 |

Incubator මිළයට ගැනීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම රු. 44,095,108.03 ක මුදලක් ලබා දෙන ලදි.

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**
**2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන්

(අගය - රුපියල්)

| විග්‍රහය | 2018 | 2017 |
|---|---|---|
| මෙහෙයුම් මත ක්‍රියාකාරකම් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | |
| ලැබීම් | | |
| ව්‍යාපෘති අදායම | 62,207,772.63 | 55,904,619.33 |
| ප්‍රවර්තන හා පර්යේෂණ ලැබීම් | 277,620,000.00 | 259,040,000.00 |
| පොලිය ලැබීම් | 7,415,183.80 | 7,680,450.93 |
| අනෙකුත් ලැබීම් | 885,376.19 | 2,629,753.80 |
| ගෙවීම් | | |
| සේවක පිරිවැය | (230,329,391.58) | (203,222,488.29) |
| විශ්‍රාම වැටුප් | 12,506,031.94 | (8,734,241.47) |
| සැපයුම් | (94,370,253.43) | (88,277,084.70) |
| අනෙකුත් ගෙවීම් | 5,655,315.63 | (27,845,139.69) |
| බදු | (371,341.84) | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | 41,218,693.34 | (2,824,130.09) |
| **ආයෝජන මගින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| වත්කම් මිළට ගැනීම් | (80,818,492.37) | (30,795,703.46) |
| උපකරණ විකුණුම් | 12,816.69 | 1,084,163.36 |
| **ආයෝජන මගින් ඉපැයූ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | (80,805,675.68) | (29,711,540.10) |
| **මූල්‍ය කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 34,900,000.00 | 37,997,000.00 |
| ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමෙන් ලද අරමුදල් | 8,524,567.15 | 35,570,540.88 |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | 43,424,567.15 | 73,567,540.88 |
| මුදල් හා සමාන වත්කම් වල (වැඩිවීම්/අඩුවීම්) | 3,837,584.81 | 41,031,870.69 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා සමාන දෑ | 136,516,464.38 | 95,484,593.69 |
| කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 140,354,049.19 | 136,516,464.38 |

**<u>ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය</u>**
**<u>2පී /17බී, කාර්මික ජනපදය, ඒකල, ජාඇල</u>**

2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සටහන

2. මුදල් නොවන ගණුදෙනු (අගය - රුපියල්)

| | 2018 | 2017 |
|---|---|---|
| භාණ්ඩාගාරයෙන් වාහන ලැබීම | - | - |
| | - | - |

3. මුදල් හා සමාන වත්කම්

| | 2018.12.31 දිනට | 2017.12.31 දිනට |
|---|---|---|
| ජංගම ගිණුම් අංක 404949 ලංකා බැංකුව ජාඇල ශාඛාව | 607,997.66 | 10,507,686.29 |
| ජංගම ගිණුම් අංක 405005 ලංකා බැංකුව ජාඇල ශාඛාව | 115,623.98 | 21,189.09 |
| ජංගම ගිණුම් අංක 404956 ලංකා බැංකුව ජාඇල ශාඛාව | 2,326,387.03 | 1,214,636.27 |
| ජංගම ගිණුම් අංක 1667 ලංකා බැංකුව, ආයතන ශාඛාව | 1,904,451.84 | 5,331,410.73 |
| අතැති මුදල් | 48,053.57 | 9,358.41 |
| තාවකාලික කැඳවුම් තැන්පතු - ජාඇල ශාඛාව | 74,200,000.00 | 53,000,000.00 |
| තාවකාලික කැඳවුම් තැන්පතු - ආයතන ශාඛාව | 55,000,000.00 | 55,000,000.00 |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත අරමුදල | 6,151,535.11 | 11,432,183.59 |
| | 140,354,049.19 | 136,516,464.38 |

## 14 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඊසී/බී/එන්ඊආර්ඩීසී/1/18/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 31 දින

සභාපති

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්

ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම් මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම් පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගත්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිඛේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනියන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇතිබව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර නාවිතා කර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) එකතු වටිනාකම රු. 11,189,088 ක් වූ නිමකළ ව්‍යාපෘති 11 කින් ලැබියයුතු වටිනාකම 2019 මාර්තු වන විටත් අයකරගෙන නොතිබූ අතර රාජ්‍ය ආයතනයක් වෙත 2018 දෙසැම්බර් 18 වන දින ලබා දුන් රු. 294,790 වූ අත්තිකාරම් මුදල 2019 මාර්තු වන විටත් පියවා නොතිබුණි. එසේම මධ්‍යස්ථානය විසින් නිමකර භාර දී තිබූ වාණිජ ව්‍යාපෘති 03 ක දෝෂ ආවරණ කාලය අවසන් වී තිබුණද රු.397,521 ක් වූ රඳවාගත් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් පේටන්ට් බලපත්‍ර ලබාගැනීම සඳහා දරන ලද වියදම් වූ රු.363,706 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. එලෙස අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.121,300 කට අදාළව පේටන්ට් බලපත්‍ර මෙතෙක් ලබාගෙන නොතිබුණි.

(ඇ) මධ්‍යස්ථානය සතුව වටිනා ග්‍රන්ථ ඇතුළත් පුස්තකාලයක් පවතින අතර එයින් බැහැරව ගෙනගිය පොත් නැවත භාරදීම් සඳහා මාසයක කාලයක් ලබා දී තිබුණද නිලධාරීන් 23 දෙනෙකු වෙත ලබා දී තිබූ පොත් 45 ක් එම කාල සීමාව තුල නැවත භාර නොදී දින 15 ක් අඩුරුයි 03 ක් අතර දීර්ඝ කාලයක් ලඟ තබාගෙන සිටීම නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ හා වාණිජ ව්‍යාපෘති

(i) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ධීවර අධිකලාප වැඩසටහන යටතේ ධීවර අගයදාම ව්‍යාපෘතිය (DPD/COM/07/54/2018 – Fabrication of smoked fish units for Ministry of Primary Industries) සඳහා දුම් මත්ස්‍ය ඒකක 03 ක් ලබා ගැනීම සඳහා 2017 පෙබරවාරි 23 දිනැදි මධ්‍යස්ථානයෙන් ඉල්ලුම් කර තිබුණද 2018 පෙබරවාරි 26 එනම් වසරක් ගතවීමෙන් පසුව ආයතනය විසින් මිල ගනන් ඉදිරිපත් කර තිබුණි. මෙම දුම් මත්ස්‍ය ඒකකය සෑදීම සඳහා මුළු මුදල හා ප්‍රවාහන ගාස්තුව සියළු බදු ඇතුලත්ව රු. 822,602 ක් වූ මුදලින් සියයට 50 ක් ගෙවූ පසු මාස 02 ක් ඇතුලත සාදා නිම කරන බවද, ඉතිරි සියයට 50 ගෙවූ පසු අම්පාර දිස්ත්‍රික්

කාර්යාලයට ප්‍රවාහනය කර දෙන බවද එකඟ වී තිබුණි. 2018 ජූලි 12 දින ව්‍යාපෘති වටිනාකමින් සියයට 50 ක් සඳහා අත්තිකාරම් මුදල් ලබා ගෙන තිබුණි. ව්‍යාපෘතිය 2018 ජූනි 25 ආරම්භ කර 2018 ඔක්තෝබර් 25 දිනෙන් අවසන් කිරීමට නියමිත වුවත් 2018 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. විගණන දිනය වන විටත් ඉන් උපකරණ 02 ක් ප්‍රවාහනය කර භාරදීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2015 ඔක්තෝබර් 15 දිනැතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම අනුව 2016 පෙබරවාරි 01 දින උළු වියලන යන්ත්‍රයක් නිර්මාණය කිරීම ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීම සඳහා එකඟතාවයකට පැමිණ තිබුණි. මේ වෙනුවෙන් රු.2,000,000 ක් පමණක් ලැබී තිබුණද රු.5,668,011 ක් වියදම් දරා තිබුණි. නමුත් යන්ත්‍රයෙහි ක්‍රියාකරවීමේ පහසුව ඉහළ නැංවීමේ කටයුතු 2019 මාර්තු වන විටත් අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය.

(iii) 2014 ජනවාරි 01 දිනෙන් ආරම්භ කොට 2015 අගෝස්තු 31 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබූ Design & Fabrication of a Hyperbaric Oxygen Chamber ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත වියදම රු.3,400,000 කි. මේ වන විට දරා ඇති මුළු වියදම රු.2,503,177 කි. විවිධ අවශ්‍යතා මත 08 වතාවක් පමණ දින දීර්ඝ කර තිබූ අතර 2019 ජනවාරි වන විටත් ලභා කරගෙන තිබුණේ සියයට 70 ක ප්‍රගතියක් පමණි. මාස 20 කින් අවසන් කිරීමට හඳුනාගත් මෙම ව්‍යාපෘතිය සඳහා දැනට වසර 4 ක් ගත වී ඇති බව නිරීක්ෂණය වූ අතර 2019 ජූනි 30 දක්වා තව දුරටත් දින දීර්ඝ කර තිබුණි.

(iv) 2015 මැයි මස ආරම්භ කරන ලද ස්වයංක්‍රිය ආප්ප නිපයුම් යන්ත්‍රය සංවර්ධනය හා වාණිජකරණය ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 31 න් අවසන් කිරීමට නියමිත වුවත් 2019 මාර්තු 31 දක්වා වරින් වර දින දීර්ඝ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.1,309,652 වැය කර වසර 04 කට ආසන්න කාලයක් ගතවී තිබුණද මෙතෙක් නිම කර නොතිබුණි.

(v) ඇස්තමේන්තුගත වටිනාකම රු. 2,040,000 ක් වූ Consultancy Services for Construction of an Exposure Room for National Centre for Non – destructive testing for Sri Lanka Atomic Energy Board ව්‍යාපෘතිය 2018 ජූලි 19 වන දින ආරම්භ කර, 2018 දෙසැම්බර් 31 දින නිම කිරීම සඳහා සැලසුම් කර තිබුණි.

ව්‍යාපෘතියේ මුල් සැලසුම් අනුව දෙවන අදියර වෙනුවෙන් ඇස්තමේන්තුගත කර ඇති කාලය මාස 04 වන නමුත් ව්‍යාපෘති කාලය වසරකින් දිර්ඝ කර තිබුණි.

(ඉ) බලපත්‍ර ලබාදීම හා අළුත් කිරීම

(i) වර්ෂය තුල බලපත්‍ර 50 ක් ලබා දීම ඉලක්ක කර තිබුණත් ලබා දීමට හැකිව ඇත්තේ බලපත්‍ර 23 ක් පමණි. ඉන් ලැබුණු ආදායම රු.93,355 කි. වර්ෂය තුල බලපත්‍ර 100 ක් අළුත් කිරීම ඉලක්ක කර තිබුණි. වර්ෂ ආරම්භයේදි බලපත්‍ර ලාභීන් 163 ක් සිටි නමුත් වර්ෂය තුල අළුත් කිරීමට ඉදිරිපත් වී ඇත්තේ ඉන් 40 ක් පමණි. ඉන් ලැබූ ආදායම රු.93,095 කි. කෙසේ නමුත් මධ්‍යස්ථානයේ බලපත්‍ර ලබාදීම්, අළුත් කිරීම් රටාව විශ්ලේෂණය කිරීමේ දී හඳුන්වා දුන් තාක්ෂණයන් බොහොමයක් රටතුළ ප්‍රමාණවත් පරිදි ප්‍රචලිත වී නොමැති බව නිරීක්ෂණය විය.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව මධ්‍යස්ථානය විසින් වර්ෂය තුල තාක්ෂණයන් 13 ක් හඳුන්වා දීම ඉලක්ක කර තිබුණත් හඳුන්වා දීමට හැකිව තිබුණේ පිරිවැය 1,102,892 ක් වූ තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 05 ක් පමණි. එම තාක්ෂණයන් සම්බන්ධයෙන්ද විගණිත දිනය වන විටත් පේටන්ට් ලබා ගැනීමක්, පේටන්ට් සඳහා ඉල්ලුම් කිරීමක්, තාක්ෂණ පැවරීම් සිදු කිරීමක් හෝ බලපත්‍ර ලබා දීමක් සිදුකර නොතිබුණි.

(ඊ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

I. 2014-2018 කාලයට අදාලව මධ්‍යස්ථානය විසින් තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 20 ක් හඳුන්වා දී තිබූ අතර ඒ සඳහා රු.15,400,882 ක පිරිවැයක් දරා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තාක්ෂණ පැවරීම සිදු කිරීමට හැකි වී තිබුනේ ඉන් පිරිවැය රු.2,589,194 ක් වූ තාක්ෂණයන් 6 ක් පමණි. හඳුන්වාදුන් අනෙකුත් තාක්ෂණයන් කිසිවක් 2019 අප්‍රේල් වන විටත් සමාජගත වී නොතිබුණි.

II. ඉපිලුම් අසව් දොරටු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය හා දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ව පිරිවැය ඇස්තමේන්තුව රු. 7,250,000 ක් වූ ආදා දොල ඇල පර්යේෂණාත්මක ඉපිලුම් අසව් දොරටු ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගතවී තිබුණි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජිත

දිනය වූයේ 2018 අප්‍රේල් 01 දින වන අතර 2018 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. මේ සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2017 දෙසැම්බර් 31 දින රු. 1,760,204 ක මුදලක් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් මුදල් ලැබී සති 03 ක් ඇතුලත අදාල කාර්යයන් ඉටු කල යුතු විය. නමුත් අදාල කාල පරිච්ඡේදය තුළ එම කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබු අතර 2019 ජනවාරි 14 දින දකුණු පලාත් වාරිමාර්ග අධ්‍යක්ෂ උක්ත දොරටුව සවි කිරීමට යෝජිත වූ ස්ථානය යෝග්‍ය නොවන බැවින් ඒ සඳහා ගෙවූ මුදල් නැවත ලබාදෙන ලෙස මධ්‍යස්ථානයට දන්වා තිබුණි. ඒ අනුව රු. 1,680,204 ක මුදලක් නැවත ගෙවා තිබුණි. පර්යේෂණාත්මක ව්‍යාපෘති ආරම්භයේදී ආයතනික මෙන්ම පාරිසරික සාධක සැලකිල්ලට ගනිමින් කටයුතු කිරීමට නොහැකි වීම මත මෙම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යාමේ හැකියාව මගහැරී තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ජපන් රජයෙන් පරිත්‍යාගයක් ලෙස පෞද්ගලික ආයතනයකට ලද පානීය ජලය පිරිසිදු කිරීම සඳහා වන උපකරණ හයක් වරායෙන් නිදහස් කිරීමේ ගාස්තුව වූ රු. 359,248 ක් අමාත්‍යාංශයේ උපදෙස් මත මධ්‍යස්ථානය විසින් දරා තිබුණි. එම වටිනාකම ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## 15 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති කරුණු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල පැහැදිළි කිරීම්

**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

1. මූල්‍ය ප්‍රකාශන

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) මෙම ව්‍යාපෘති 11 අතරින් පහත ව්‍යාපෘති 8 සඳහා ලැබිය යුතු මුදල් එක්රැස් කර ගැනීමට මේ වනවිට කටයුතු කරමින් පවතී. අවස්ථානුකූල හා නිරන්තර මතක් කරලීම් දුරකථන හා ලිඛිත ක්‍රමවේදයනට පවත්වාගෙන ගොස් ඇත.

| ව්‍යාපෘති අංකය | | වටිනාකම |
|---|---|---|
| DPD/COM/6-2/12/18 | | 3,405,230.53 |
| DPD/COM/06/63/18 | | 4,147,826.08 |
| DPD/COM/06/62/18 | | 83,635.59 |
| DPD/COM/06/39/18 | | 2,731,524.81 |
| DPD/COM/06/70/18 | | 174,736.69 |
| DPD/COM/07/56/18 | | 87,821.31 |
| DPD/COM/06/(1)/61/18 | | 106,521.74 |
| DPD/COM/06/68/18 | | 91,649.41 |
| | එකතුව | **10,828,946.16** |

DPD/COM/07/52/18 රු 420,189.30 මේ වනවිට පියවී ඇත.
මෙහි යම් කලක් පැරණි වූ ව්‍යාපෘති දෙකෙහි තත්වයද මෙසේය.

RED/COM/11/121/2014 - මෙතෙක් අවසන් වතාවට 2019.04.08 වැනි දින මධ්‍යස්ථානයේ ඉහල කළමණාකාරිත්වය මගින්ද මතක් කරලීමේ ලිපියක් ලබා ඇත. එය දුරකථන ඇමතුම් මතක් කරලීම් වලට අමතරවය. මෙය නිසි ලෙස ක්‍රියාත්මක වන කටයුත්තක් බැවින් මුදල් ප්‍රමාද වී හෝ ලැබෙනු ඇති බවට විශ්වාසය පවතී.

MED/COM/118/15 - මෙහි දෝෂ නිරීක්ෂණ කාලය 2018.12.23 තෙක් පැවතුණි. ඉන් අනතුරුව අවසන් ලිඛිත ඉල්ලීම 2019.04.18 වන දින කර ඇති අතර දුරකථන මගින් මුදල් ඉල්ලා සිටීමේදී එය ගෙවීමට කටයුතු කරන බව පවසනු ලැබීය.

මෙහි දක්වා ඇති වාණිජ ව්‍යාපෘති 03 හි විස්තර පහත පරිදි වේ.

1. Construction of Crematorium (LPG) - Dibulagala,Polonnaruwa (REP/COM/146/2014)
2. Construction of Crematorium (LPG) - Alahara,Polonnaruwa (REP/COM/147/2014)
3. Construction of Incinerator at Dehiwala Zoological Garden (REP/COM/67/2015)

මෙහි මුල් ව්‍යාපෘති දෙක සඳහා රඳවා ගැනීමේ මුදල් ලබා ගැනීම සඳහා ඉල්ලීම් සිදුකර ඇති අතර, නිරන්තරයෙන් සිහි කැඳවීම් කරණු ලැබේ. මෙම අවසන් ව්‍යාපෘතිය දෙහිවල සත්වෝද්‍යාන සඳහා කසල දාහකයක් පිලිසකර කිරීම වන අතර, මෙම ව්‍යාපෘති කාලය තුළදී ඇතිවූ දෝෂයක් නැවත නිවැරදි කිරීමට නොහැකි වී ඇති බැවින්, මෙම රඳවා ගත් මුදල් නිදහස් කිරීමට මෙම මෙම දෝෂය නිවැරදි කරන තුරු සිටිය යුතුය.

මෙහි රාජ්‍ය ආයතනයක් වෙත ගෙවා ඇති අත්තිකාරම් මුදලක් ලෙස දක්වා ඇත්තේ සැලසිනේ ආයතනය සඳහා "Video Documentary" එකක් සෑදීම සඳහා ගෙවන ලද මුදල වන අතර, මේ වන විට මෙම අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා කටයුතු කර ඇත.

(ආ) පේටන් බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් ගෙවන ලද මෙම රු. 121,300/-ක් වන මුදල අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කර ඇත්තේ අතපසු වීමකිනි. මෙය 2019 ගිණුම් වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරණු ඇත.

(ඇ) ආයතනයේ පුස්තකාලයේ පරමාර්ථය වනුයේ ආයතනයේ පර්යේෂණ හා අනෙකුත් සේවා කටයුතු වලදී අවශ්‍ය වන්නා වූ විට පරිශීලනය කිරීම සඳහා අවශ්‍ය පොත්පත් ලබා දීමයි. සමහර පර්යේෂණ කටයුතු සඳහා දිගු කාලයක් සමහර පොත් භාවිතා කිරීමට සිදු වේ. එවිට එම පොත් දිගු කාලයක් ලඟ තබා ගැනීමට අවසර දෙනු ලැබේ. පොත් බැහැරව ගෙන යාමට මාසයක කාලයක් යොදා ඇත්තේ එක දිගටම භාවිතා කිරීමට අවශ්‍ය නොවන අවස්ථා සඳහාය.

**(ඈ) <u>පර්යේෂණ හා වාණිජ ව්‍යාපෘති</u>**

(i) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ ධීවර අධිකලාප වැඩසටහන යටතේ ධීවර අගයදාම ව්‍යාපෘතිය (DPD/COM/07/54/2018 – Fabrication of Smoked Fish Units for Ministry of Primary Industries)

මෙම ව්‍යාපෘතිය සඳහා දුම් හා මත්ස්‍ය ඒකක තුනක් (03) ලබා ගැනීම සඳහා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ඉල්ලුම් කරන ලද දිනය 2017.02.23 ලෙස සඳහන් කර තිබීම සත්‍ය නොවේ. එම අමාත්‍යාංශයේ ප්‍රමාදදෝෂයකින් එම දිනය 2017.02.23 ලෙස සඳහන් කර තිබුණද එය සැබෑ ලෙස 2018.02.23 ලෙස නිවැරදි විය යුතුය. ඒ අනුව ඊට පිලිතුරු ලෙස අප ආයතනය විසින් යවා ඇති ඇස්තමේන්තුව සඳහන් ලිපියේද එම දිනය එලෙසම සඳහන් වී ඇත.

ඉහත මත්‍යස ඒකක ලබාදීම සඳහා අප විසින් යවන ලද ඇස්තමේන්තුවට අදාල ලිපිය හා නාම මාත්‍ර ඉන්වොයිස් පතෙහි සඳහන් තොරතුරු වලට අනුව එම ඇස්තමේන්තු මුදල, ප්‍රවාහන සහ සියලු බදු මුදල් ඇතුළත්ව රු. 822,602.04 ක් බව සත්‍යයකි. තවද එම මුදලින් 50% ක අත්තිකාරම් මුදලක් ගෙවූ පසු මාස දෙකක් ඇතුළතදී භාණ්ඩ අම්පාර දිස්ත්‍රික් කාර්යාලයට ප්‍රවාහනය කර දෙන බව තවදුරටත් එම ලිපියේ දන්වා තිබීම හා 2018 ජූලි 12 වෙනි දින 50% ක අත්තිකාරම් මුදල ලබා ගත් බවද සත්‍යයකි. මෙම ව්‍යාපෘතියේ වලංගු කාලය ලෙස 2018 ජූනි 25 සිට 2018 ඔක්තෝම්බර් 25 දක්වා වුවත් පසුව ඇතිවූ තත්ත්වයන් මත එම කාලය 2018 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කිරිමද සත්‍යයකි. එහෙත් එම භාණ්ඩ 2018.10.05 වන විට සාදා නිමකර ඇති බව ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත දුරකථනයෙන් හා ලිපි මඟින් දැනුම් දී ඇත. එහෙත් ඉල්ලුම් කරුගේ ප්‍රමාද දෝෂයන් හා උපකරණ බෙදාදීම සඳහා වූ සැළැසුම් වල අකාර්යක්ෂමතාවය නිසා නිම කරන ලද භාණ්ඩ එම අමාත්‍යාංශය විසින් නම් කරනු ලැබූ ස්ථානයකට ප්‍රවාහනය කිරීම සඳහා එම කාලය තුළ අපට අවශ්‍ය උපදෙස් නොලැබුණි. තවද ඉතිරි 50% ක මුදල ඔවුන් අප වෙත ලබාදීමට කටයුතු කර ඇත්තේද 2019.01.28 වන දිනදිය. එයද ඔවුන්ගේ සිදුවූ ප්‍රමාදදෝෂයක් ලෙස දැක්විය හැකිය.

(ii) උළු වියලන යන්ත්‍රයේ ක්‍රියා කරවීමේ පහසුව ඉහල නැංවීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් 2018.12.05 දින කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය වෙත යෝජනාවලියක් ඉදිරිපත් කර ඇති අතර, මේ කාර්යය සඳහා රුපියල් මිලියන 2.7 ක මුදලක් අවශ්‍ය බවද දන්වා ඇත.

2019.02.28 දින කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සමග සාකච්ඡාවක් ද, 2019.03.26 දින අදාල පර්ශවයන් සමග නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟතාවය බලාපොරොත්තු වේ.

(iii) රු. 3,400,000.00 ක ඇස්තමේන්තු මුදලක් සහිතව 2014 ජනවාරි 01 දිනෙන් ආරම්භ කරන ලද **Design & Fabrication of a Hyperbaric Oxygen Chamber** ව්‍යාපෘතිය 2015 අගෝස්තු 31 න් අවසන් වීමට නියමිතව තිබුණ බව සත්‍යයකි. මෙම උපකරණය රෝගීන් සඳහා භාවිතා කරනු ලබන වෛද්‍ය උපකරණයක් බැවින් එහි අවධානම් හා සංකීර්ණත්වය හේතු කොට ගෙන වරින් නර නිර්මාණාත්මක සංශෝධන අවශ්‍යතා පදනම් කරගෙන අට (08) වතාවක් පමණ ව්‍යාපෘතිය දීර්ඝ කර ඇති බවද සත්‍යයකි. ව්‍යාපෘතිය කරගෙන යාමේදි ඇති වූ අනපේක්ෂිත සිදුවිම්ද මෙයට හේතු වී ඇත. ඒ අනුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනිම අපහසු වුවත් ව්‍යාපෘතියේ ඇති වටිනාකම සැළකිල්ලට ගෙන කෙසේ හෝ එය සාර්ථක කර ගැනිමේ අපේක්ෂාවෙන් මේ වන විටත් කටයුතු කරමින් පවතී. ඒ අනුව ව්‍යාපෘතිය 2019 ජූනි 30 දක්වා තව දුරටත් දීර්ඝ කර එම කටයුතු කරමින් පවති.

(iv) ස්වයංක්‍රීය ආප්ප නිපයුම් යන්ත්‍රය සංවර්ධනය හා වානිජකරණය ව්‍යාපෘතිය අදියර දෙකකින් සමන්විත වූ අතර ප්‍රථම අදියරේදී අර්ධ ස්වයංක්‍රීය ආප්ප යන්ත්‍රයේ පර්යේෂණ කටයුතු අවසන් කර එයින් යන්ත්‍ර 10ක් නිපදවා ක්ෂේත්‍ර පරීක්ෂණද අවසන් කොට පලමු අදියර අවසන් කරන ලදී. පලමු අදියරේ ඇති වූ තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම ආදී කටයුතු සඳහා බලාපොරොත්තු වූවාට වඩා වැඩි කාලයක් ගත විය.

දෙවන අදියරේදී ස්වයංක්‍රීය ලොකු ප්‍රමානයේ ආප්ප යන්ත්‍රයේ පර්යේෂණ කටයුතු අවසන් කිරීම, ආප්ප නිපදවා පරීක්ෂා කිරීම ආදී සියලුම කටයුතු අවසන් කරන ලදී. විටින් විට මතු වූ තාක්ෂණික ගැටළු විසඳීම සඳහා අමතර කාලයක් ගත වීම නිසා සමස්ථ ව්‍යාපෘතිය අවසන් කිරීමට බලාපොරොත්තු නොවූ අමතර කාලයක් ගත විය. මේ වන විට පර්යේෂණ ව්‍යාපෘතිය නිමකොට ඇත.

(v). **Consultancy Services for Construction of an exposure Room for National Centre for Non-Destructive testing for Sri Lanka Atomic Energy Board ව්‍යාපෘතිය** 2018 වර්ෂයේ අවසාන වන විට නිර්මාණය කිරීමේ අදියර අවසාන කර කොන්ත්‍රාත් ප්‍රදානය සම්බන්ධයෙන් පරමාණු බලශක්ති අධිකාරිය වෙත නිර්දේශයද ඉදිරිපත් කර අවසන් කර තිබුණි. නමුත් කාලය දීර්ඝ කිරීමේ පෝරමය ඉදිරිපත් කරන අවස්ථාව වන විට පරමාණු බලශක්ති අධිකාරිය අප වෙත දැනුම් දී සිටියේ තෝරාගනු ලැබූ කොන්ත්‍රාත් කරු වෙත අත්කිකතාරම් මුදල් ගෙවීම 2019 අප්‍රේල් මාසය වන තෙක් ප්‍රමාද වන බවය.

ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භය 2019 අප්‍රේල් මාසය දක්වා ප්‍රමාද වූ අතර ව්‍යාපෘතිය අවසන් කර අවසාන බිල් පත ගෙවා නිම කිරීම සඳහා ව්‍යාපෘති කාලය 2019 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කර ගන්නා ලදී.

## (ඉ) බලපත්‍ර ලබාදීම හා අළුත් කිරීම

(i) තාක්ෂණය පැවරීම් 50 සිදු කිරීමට අපේක්ෂා කල ද තාක්ෂණ ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූයේ ව්‍යාවසායකයින් 23 දෙනෙකු පමණක් වන අතර ව්‍යාවසායකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාරය ඉතාමත් අඩු මට්ටමක පැවතිණ. සමහර තාක්ෂණයන් දැනටමත් වලංගු කාලය ඉක්මවා ඇති බැවින් එම තාක්ෂණයන්ට අදාල බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කිරීමට උනන්දු වී නොමැත.

ව්‍යවසායකයින් / බලපත්‍රලාභීන් දිරි ගැන්වීම සඳහා අප විසින් ප්‍රචාරක කටයුතු වැඩිදියුණු කිරීමටත් ගම් මට්ටමින් තාක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා විද්‍යා කාර්යාලය සම්බන්ධ කර අපගේ තාක්ෂණයන් පිළිබඳව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් සියලු දිස්ත්‍රික්ක හරහා ක්‍රියාත්මක කිරීමටත් පියවර ගෙන ඇත.

(ii) ක්‍රියාකාරී සැලැස්මට අනුව තාක්ෂණයන් 13ක් 2018 වර්ෂය තුළදී හඳුන්වා දීමට සැලසුම් කලත්, ඊට අදාල වන්නා වූ ව්‍යාපෘතීන් වර්ෂය තුළදී නිම කිරීමට නොහැකි වූයෙන් හඳුන්වාදීමට හැකි වූයේ තාක්ෂණයන් 5ක් පමණි. පර්යේෂණ ව්‍යාපෘතීන් සැලසුම් කළ ආකාරයට නියමිත දිනයේදීම සාර්ථකව අවසන් කිරීම, සෑම විටම සිදු නොවේ. හඳුන්වා දෙන ලද තාක්ෂණයන් සඳහා තාක්ෂණ පැවරීම ඉදිරියේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. එසේම සෑම තාක්ෂණයක් සඳහාම පේටන් බලපත්‍ර ලබාගත නොහැකි අතර, පේටන් බලපත්‍ර ලබාගත හැකි තාක්ෂණයන් සඳහා ඉදිරියේදී පේටන් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරණු ලැබේ.

(ඊ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

(i) 2014-2018 කාලය තුලදී හදුන්වා දී ඇති තාක්ෂණයන් 20 න් 2018 දෙසැම්බර් වන විට තාක්ෂණයන් 6 ක් ව්‍යවසායකයින්ට පවරා ඇත. තාක්ෂණයන් 4 ක් සඳහා අදාල උපකරණ කිහිපයක් නිෂ්පාදනය කොට විකිණීම මගින් සමාජගත කර ඇත. තවත් තාක්ෂණයන් 5 ක් සඳහා ආයතනය ක්ෂේත්‍ර පරීක්ෂණ කරමින් පවතී. මේ අනුව මෙම තාක්ෂණයන් පැවරීමට සහ සමාජගත කිරීමට කටයුතු ඉදිරියේදී කරණු ලැබේ.

(ii) ඉපිලුම් අසව් දොරටු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයෙහි පිහිටි ආදා දොළ ආශ්‍රිතව ඇතිවන්නා වූ ගං වතුර උවදුර පාලනය කිරීමේ අරමුණින්, දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, එම දෙපාර්තමේන්තුව හා අප ආයතනය එකතුව පර්යේෂණාත්මක ඉපිලුම් අසව් දොරටුවක් සවි කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යෝජනා වූ අතර, ඒ අනුව නර්ඩ ආයතනය විසින් අදාල ඉපිලුම් දොරටුව සැළසුම් කිරීම හා ඉදිකිරීමටත්, ඒ සඳහා අපේ මුළු ඇස්තමේන්තුව වූ රු. 7,250,000/- ක මුදල දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අපට ගෙවීමට එකඟ වූ අතර, අත්තිකාරම් වශයෙන් රු. 1,500,000 ක් ගෙවන ලදී.

එසේම, මේ සඳහා වූ ව්‍යුහාත්මක ඉදිකිරීම් සළසුම් කිරීම හා ඉදිකිරීම අපගේ උපදෙස් අනුව දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට නියමිතව තිබිණ. ඒ සඳහා වියදම් ඔවුන් විසින් දැරීමට එකඟ වී තිබිණ. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අසව් දොරටුවෙහි, අවශ්‍යතාවයන්ට අනුව ව්‍යුහාත්මකව ඉදිකිරීම සඳහා සැළසුම් හා මූලික ඇස්තමේන්තු සකස් කිරීමේදී, ඔවුන් හට පෙනී ගියේ ඒ සඳහා ඔවුන් බලාපොරොත්තු වූ වාට වඩා විශාල මුදලක් වැය වන බවයි. ඒ අනුව, ඒ සඳහා මුදල් වෙන්කිරීමක් නොමැති බැවින්, දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතිය සිදු නොකිරීමට තීරණය කරන ලද අතර, අප හට ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත ඔවුන් වෙත ගෙවන ලෙස ඉල්ලා සිටින ලදී. ඒ අනුව මේ සඳහා අවශ්‍ය මූලික වැඩ සඳහා වියදම් වූ මුදල වූ රු.80,000/- ක් අඩු කරගනිමින් ඉතිරි මුදල දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවන ලදි.

(උ) විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලැබිය යුතු මෙම රු.359,498.39 මුදල ලබා ගැනීම සඳහා මධ්‍යස්ථානය මගින් කටයුතු කරමින් පවතී.

ඉංජි.සී එම් දෙල්පවිත්‍ර
සභාපති

ඉංජි. ඩී ඩී ආනන්ද නාමල්
අධ්‍යක්ෂ ජනරාල්